**පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 242**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
දසවැනි පාර්ලිමේන්තුව
(පළමුවැනි සභාවාරය)

# පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ තෙවැනි වාර්තාව

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති
පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා විසින්
2025 ජූලි මස 24 වැනි දින ඉදිරිපත් කරන ලදී

*2025 ජූලි මස 24 වැනි දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් මුද්‍රණය කළ යුතු යැයි නියෝග කරන ලදී.*

**<u>පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සාමාජිකයන්</u>**

**<u>දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය</u>**

1. ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා, පා.ම., (සභාපති)

2. ගරු මනෝ ගනේෂන් මහතා, පා.ම.,
*(2025.03.21 දින පත්කරන ලදී.)*
3. ගරු (නීතිඥ) දයාසිරි ජයසේකර මහතා, පා.ම.,
*(2025.05.20 දින පත්කරන ලදී)*
4. ගරු (නීතිඥ) අර්ජුන සුජීව සේනසිංහ මහතා, පා.ම.,
*(2025.03.21 දින පත්කරන ලදී)*
5. ගරු ඩී.වී. චානක මහතා, පා.ම.,
*( 2025.03.21 දින පත්කරන ලදී)*
6. ගරු (නීතිඥ) අනුරාධ ජයරත්න මහතා, පා.ම.,
*(2025.03.21 දින පත්කරන ලදී)*
7. ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා, පා.ම.,
*( 2025.03.21 දින පත්කරන ලදී)*
8. ගරු. එස්.එම් මරික්කාර් මහතා, පා.ම.,
*(2025.03.21 දින පත්කරන ලදී)*
9. ගරු මුජිබුර් රහුමාන් මහතා, පා.ම.,
*(2025.05.20 දින පත්කරන ලදී)*
10. ගරු චමින්ද විජේසිරි මහතා, පා.ම.,
*(2025.03.21 දින පත්කරන ලදී)*
11. ගරු අබූබකර් අතම්බාවා මහතා, පා.ම.,
*( 2025.05.08 දින පත්කරන ලදී)*
12. ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා, පා.ම.,

13. ගරු අර්කම් ඉල්යාස් මහතා,පා.ම.,
*( 2025.05.08 දින පත්කරන ලදී)*
14. ගරු (නීතිඥ) නිලන්ති කොට්ටහච්චි මහත්මිය, පා.ම.,
*(2025.03.21 දින පත්කරන ලදී)*
15. ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය, පා.ම.,

16. ගරු දිලිත් ජයවීර මහතා, පා.ම.,
*(2025.03.21 දින පත්කරන ලදී)*

*17.* ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා, පා.ම.,
*(2025.05.08 දින පත්කරන ලදී)*

18. ගරු සුජීව දිසානායක මහතා, පා.ම.,

19. ගරු සුදත් බලගල්ල මහතා, පා.ම.,

20. ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා, පා.ම.,

21. ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා, පා.ම.,
*(2025.03.21 දින පත්කරන ලදී)*

22. ගරු ජගත් මනුවර්ණ මහතා, පා.ම.,

23. ගරු රුවන් මාපලගම මහතා, පා.ම.,

24. ගරු සුනිල් රාජපක්ෂ මහතා, පා.ම.,

25. ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා, පා.ම.,

26. ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා, පා.ම.,

*27.* ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා, පා.ම.,
*(2025.03.21 දින පත්කරන ලදී)*

28. ගරු තිළිණ සමරකෝන් මහතා, පා.ම.,

29. ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා, පා.ම.,

30. ගරු (නීතිඥ) ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය, පා.ම.,

31. ගරු දිනේෂ් හේමන්ත මහතා, පා.ම.,
*( 2025.03.21 දින පත්කරන ලදී)*

*පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 242*

<u>**කාරක සභා ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය**</u>

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වත්මන් කාර්ය මණ්ඩලය පහත පරිදි වේ.

| | |
|---|---|
| සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) | හිමාලි සමරදිවාකර මෙය |
| ප්‍රධාන නිලධාරි | එච්. ආර්. ද සොයිසා මිය |
| නියෝජ්‍ය ප්‍රධාන නිලධාරී | එස්. එල්. වික්‍රම මයා |
| පාර්ලිමේන්තු නිලධාරී | ජී. වී. එස්. කේ. කුමාරි මිය |
| පාර්ලිමේන්තු නිලධාරී | අයි. එස්. ගෝමස් මිය |
| පාර්ලිමේන්තු නිලධාරී | ජී. එල්. ඩී. ප්‍රනාන්දු මිය |

<u>**කාරක සභා වාර්තා**</u>

<u>www.parliament.lk</u> යන වෙබ් අඩවියෙන් පහත සඳහන් ගමන් මාර්ගය ඔස්සේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තා බාගත කළ හැක.

<u>www.parliament.lk</u>

↓

සිංහල

↓

පාර්ලිමේන්තුවේ කටයුතු

↓

කාරක සභා

↓

කාරක සභා වාර්තා

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දසවැනි පාර්ලිමේන්තුවේ*
*පළමුවැනි සභාවාරයේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ තෙවැනි වාර්තාව*

## පටුන


| | පිටු අංක |
|---|---|
| සභාපතිතුමාගේ සටහන | VI |
| මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතය | 01 |
| පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මගින් විමර්ශනය කරන ලද ආයතනය<br>ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලය | 02-43 |

*පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 242*

## සභාපතිතුමාගේ සටහන

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභා වාරයේදී 2025 මැයි 15 වැනි දින සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතට ගැනෙන ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල් මණ්ඩලය පරීක්ෂාවට ලක් කරන ලදී. එහිදී 2022 හා 2023 වර්ෂයන්හි විගණකාධිපති වාර්තා සහ වර්තමාන කාර්යය සාධනය පිළිබඳව පරීක්ෂා කළ අතර, ආයතනයේ ක්‍රියාකාරීත්වයට අදාළ මූල්‍ය තත්ත්වය, වාණිජ හා මෙහෙයුම් වාර්තා, අභ්‍යන්තර පාලන ක්‍රම, ආදායම් හා වියදම් සැලසුම් ඇතුළත්ව රෝහල් මණ්ඩලයේ පරිපාලනමය හා නෛතික වගකීම් පිළිබඳව සවිස්තරාත්මකව සිදුකළ විමර්ශනයට අදාළව සකස් කළ වාර්තාව මේ සමග ඉදිරිපත් කරමි.

"2030 වසර වන විට කලාපයේ හොඳම සෞඛ්‍ය සේවා සපයන්නන් අතර ප්‍රමුඛයා වීම" දැක්ම කර ගත් මෙම ආරෝග්‍යශාලා මණ්ඩලයේ මෙහෙවර වන්නේ ජනතාවගේ සෞඛ්‍ය වැඩිදියුණු කරමින් උසස් තත්ත්වයේ සහනදායී සහ පරිපූර්ණ සෞඛ්‍ය සේවාවක් ලබා දීමයි. මෙය 1983 අංක 54 දරන ජයවර්ධනපුර රෝහල් මණ්ඩල පනත යටතේ 1983 දෙසැම්බර් 29වැනි දින ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල් මණ්ඩලය නමින් සංස්ථාපනය කර ඇත. දේශීය හෝ විදේශීය ප්‍රභවයන්ගෙන් මුදලින් හෝ ද්‍රව්‍ය වශයෙන් ලැබෙන ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග මගින් මණ්ඩලයේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සිදු කරනු ලබන මෙම ආයතනය, පනතේ 3(අ) වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයින් 08 දෙනෙකුගෙන් සහ නිලබලයෙන් පත් කරනු ලබන සාමාජිකයන් 03 දෙනෙකුගෙන් යුතු මණ්ඩලයක් මගින් පාලනය වනු ලැබේ.

ජනතාව විසින් පාර්ලිමේන්තුවට පවරා ඇති, ජනතාව සතු පරමාධිපත්‍ය බලය ක්‍රියාවට නැගීමේදී, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වශයෙන් මා ඇතුළු කාරක සභා සාමාජිකයින් 31 දෙනා විසින් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල් මණ්ඩලය තම පරමාර්ථ කොතෙක් දුරට ළඟා කර ගෙන තිබේද යන්න පිළිබඳව මෙහිදී විමර්ශණය කරන ලදී.

එහිදී ආරෝග්‍යශාලා මණ්ඩලය පිහිටුවීමේදී සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කළ අරමුණු හා එහි ක්‍රියාකාරීත්වය පිළිබඳව අවධානය යොමු කළ අතර මෙහෙයුම් ක්‍රියාවලියේදී සිදු වී තිබූ විතැන්වීම් සම්බන්ධයෙන් දීර්ඝ විමර්ෂණයකින් අනතුරුව සුදුසු නිර්දේශ ලබා දීම ද කාරක සභාවක් ලෙස අප විසින් සිදුකරන ලදී.

මෙම කාර්යභාරය සාර්ථකව ඉටුකර ගැනීම සඳහා, කථානායකතුමා ප්‍රධාන පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලයෙන් ලැබෙන සහායත්, භාණ්ඩාගාර නිලධාරීන්, කාරක සභාවේ උපදේශකතුමා, සහ විගණකාධිපතිතුමා ප්‍රධාන ජාතික විගණන කාර්යාලයෙන් ලැබෙන සහයෝගයත් අගය කොට සලකමි.

**වෛද්‍ය නිශාන්ත සමරවීර**
සභාපති
පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව

**දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය**
**පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ තෙවැනි වාර්තාව**

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ තෙවැනි වාර්තාව ඉදිරිපත් කරන්නේ සතුටිනි.

රාජ්‍ය සංස්ථා සහ මුළුමනින්ම හෝ කොටසක් ආණ්ඩුව විසින් අරමුදල් සපයනු ලබන ආයතන වල ගිණුම් සහ යම් ලිඛිත නීතියක් මගින් ආණ්ඩුවට පවරා ගන්නා ලද යම් ව්‍යාපාරයක් හෝ වෙනත් පැවරීමක් සම්බන්ධව පාර්ලිමේන්තුව ඉදිරියේ තබනු ලබන ගිණුම්, විගණකාධිපතිවරයාගේ සහාය ඇතිව පරීක්ෂා කිරීම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කාර්යය වේ.

වර්තමානයේ දී, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ අධීක්ෂණය යටතට ගැනෙන, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව හා අය වැය දෙපාර්තමේන්තුව යටතේ නියාමනය වනු ලබන පොදු ව්‍යාපාර 457 ක් පවතී. (මූලාශ්‍රය: රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව)

ඒ අතරින්, 2025.05.15 දින වැනි දින පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ විෂය පථයට අයත් ශ්‍රී ජයවර්ධනපුර මහාරෝහලශාලා මණ්ඩලයේ 2022 සහ 2023 වර්ෂවලට අදාළ විගණකාධිපති වාර්තා, සහ වර්තමාන කාර්යසාධනය පරීක්ෂාවට ලක් කොට කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ මෙම වාර්තාවට අන්තර්ගත කර ඇත.

*පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 242*

**<u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතය</u>**

ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලය විසින් 2022, 2023 හා 2024 වර්ෂයන්ට අදාළව ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ මතය පහතින් දක්වා ඇත.

| <u>ආයතනය</u> | <u>විගණන මතය</u> | | |
|---|---|---|---|
| | **<u>2022</u>** | **<u>2023</u>** | **<u>2024</u>** |
| ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය | තත්ත්වාගණනය කළ මතය |

**<u>විගණන මත වර්ග</u>**

## 01 <u>තත්ත්වාගණනය නොකළ මතය</u> (Unqualified Opinion)

මූල්‍ය ප්‍රකාශන ආයතනයේ මූල්‍ය තත්ත්වය සාධාරණව ඉදිරිපත් කර ඇති බව

## 02 <u>තත්ත්වාගණනය කළ මතය</u> (Qualified Opinion)

වාර්තාවේ සඳහන් කරුණුවලින් වන බලපෑම හැර ආයතනයේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව.

## 03 <u>මතය ව්‍යාචනය කිරීම</u> (Disclaimer of Opinion)

ප්‍රමාණවත් හෝ උචිත විගණන සාක්ෂි හඳුනාගැනීමට නොහැකිවීම නිසා ගිණුම් සම්බන්ධව මතයක් ප්‍රකාශ කළ නොහැකි බව.

## 04 <u>අහිතකර මතය</u> (Adverse Opinion)

ආයතනයේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව.

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දසවැනි පාර්ලිමේන්තුවේ*
*පළමුවැනි සභාවාරයේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ තෙවැනි වාර්තාව*

**ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලය**
***(සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය)***
**විමර්ශනය කරන ලද දිනය - 2025.05.15**

**සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු**

**01. දැක්ම සහ මෙහෙවර**
1983 අංක 54 දරන ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩල පනත ප්‍රකාරව ස්ථාපිත ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ දැක්ම වන්නේ '2030 වන විට කලාපයේ හොඳම සෞඛ්‍ය සේවා සපයන්නන් අතර ප්‍රමුඛයා වීම' බවත්, මෙහෙවර ලෙස 'තෘප්තිමත් කාර්ය මණ්ඩලයක් සමඟින්, වඩාත් නවීන ප්‍රතිකාර ක්‍රම භාවිතයෙන් ජනතාවගේ සෞඛ්‍ය වැඩිදියුණු කරමින් ඔවුන්ගේ වේදනා සහ අපහසුතා සමනය කිරීමෙන් උසස් තත්ත්වයේ, සහනදායී සහ පරිපූර්ණ සෞඛ්‍ය සේවාවක් ලබාදීම' බවත් කාරක සභාව නිරීක්ෂණය කළාය.

රජයේ සහ පෞද්ගලික රෝහල් පද්ධති අතරමැදි තත්ත්වයක් නියෝජනය කරන මෙම ආයතනයේ දැක්ම සහ මෙහෙවරට ගැලපෙන අයුරින් කටයුතු කර නොමැති බැවින් ඒ සම්බන්ධයෙන් ඉදිරියේදී සම්පූර්ණ කතිකාවක් පැවැත්වීම සුදුසු බවද කාරක සභාව අවධාරණය කළාය.

**කාරක සභාවේ නිර්දේශ**

**I. මෙම ආයතනය එහි දැක්ම යටතේ නිවැරදිව ස්ථානගත කිරීමට කටයුතු කිරීම.**

**II. ව්‍යාපාරික ආකෘතිය තුළ ගුණාත්මක සේවා සහනදායි මිලට සපයන, සෙසු පෞද්ගලික රෝහල්වලට ද මිල නියාමනයට මඟ පෙන්වන ලාභ ලබන කාර්යක්ෂම රාජ්‍ය ව්‍යවසායක් ලෙස ක්‍රියාත්මක වන රෝහලක් බවට පත් කිරීම**

<u>**නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**</u>

ලේකම් - සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

සභාපති - ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා මණ්ඩලය

<u>**කාරක සභා නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය**</u>

නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය 2025.06.30 වැනි දින තෙක් කාරක සභාවට වාර්තා කර නොමැත.

**02.** <u>**සංයුක්ත සැලැස්ම**</u>

ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා මණ්ඩලයට 2024-2026 වර්ෂ සඳහා සංයුක්ත සැලැස්මක් (Corporate Plan) පිළියෙල කර ඇති බව සහ 2022 සහ 2023 වර්ෂ දෙක සඳහා වාර්ෂික ක්‍රියාකාරි සැලසුම් ද (Annual Action Plans) පිළියෙල කර ඇති බව කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලදී.

<u>**කාරක සභාවේ නිර්දේශ**</u>

**I. දේශපාලනික, හා ප්‍රතිපත්තිමය වෙනස්කම්වලට අනුරූප වන පරිදි, ආයතනයේ නිලධාරින්ගේ මැදිහත්වීම මත ඉදිරි කාලය සඳහා ආයතනයට වඩාත් සුදුසු, යාවත්කාලින, සංයුක්ත සැලැස්මක් සකස් කිරීම.**

**II. නව සංයුක්ත සැලැස්මේ පිටපතක් කාරක සභාවට සහ විගණකාධිපතිට ඉදිරිපත් කිරීම.**

<u>**නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**</u>

සභාපති - ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා මණ්ඩලය

<u>**කාරක සභා නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය**</u>

නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය 2025.06.30 වැනි දින තෙක් කාරක සභාවට වාර්තා කර නොමැත.

**03. ක්‍රියාකාරි සැලැස්ම**

2022 සිට 2023 වර්ෂය දක්වා වූ වර්ෂ 02 සඳහා පිළියෙල කර තිබුණු වාර්ෂික ක්‍රියාකාරි සැලැසුම්වලට අනුව ඒ ඒ වර්ෂයන්හි ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 81 ක් වූ කාර්යයන් 06 ක් 2025 අප්‍රේල් 20 දින වන විටත් ආරම්භ කර නොමැති වීම සම්බන්ධව කාරක සභාවේ අවධානය යොමු විය.

**3.1 විදුලිබල සැපයුම වැඩිදියුණු කිරීම හා පුළුල් කිරීම**

2022 වසරේදී රුපියල් මිලියන 28ක වියදමින් විදුලිබල සැපයුම පුළුල් කිරීමට සැලසුම් කළ ව්‍යාපෘතිය, ජපන් ආධාර යටතේ සූර්යකෝෂ පද්ධතියක් ලබාදීමට තීරණය කිරීමෙන් අනතුරුව නවතා ඇති අතර, සූර්යකෝෂ පද්ධතිය සවිකිරීම සඳහා ජපාන සමාගමක් මේ වනවිට කටයුතු කරමින් සිටින බවට කාරක සභාවට කරුණු අනාවරණය විය.

**1.2 විදුලි පද්ධතියේ ආරක්ෂාවට ගෙන් වූ උපකරණ ප්‍රධාන පද්ධතියට සම්බන්ධ කිරීම**

විදුලි පද්ධතියේ ආරක්ෂාව සඳහා 2020 දී ආරම්භ කළ UPS පද්ධතිය සඳහා වැඩ අවසන් බව සඳහන් කර රුපියල් 5,778,000 ක් ගෙවා ඇති නමුත්, 2025 වනවිටත් එය ප්‍රධාන පද්ධතියට සම්බන්ධ කර නොමැතිව රෝහල් කාමරයක තබා ඇති බව කාරක සභාවට නිරීක්ෂණය විය. මෙම තත්ත්වය හදිසි විදුලි බිඳවැටීම්වලදී බරපතල අනාරක්ෂිත තත්ත්වයක් උද්ගත වීමට හේතු විය හැකි බවත්, රෝහල් අධ්‍යක්ෂවරයා, සැපයීම් නිලධාරිගේ නිර්දේශ මත අදාළ ගෙවීම් සිදු කර ඇති බව නිරීක්ෂණය කළ කාරක සභාව මෙම නිලධාරීන් දෙදෙනාම මේ පිළිබඳව නොදැන සිටීම බරපතල ගැටලුවක් බව අවධාරණය කළාය.

**1.3 හෘද ශල්‍යාගාරය සඳහා සුදු යකඩ දොරක් සවි කිරීම**

2022 වසරේදී හෘද ශල්‍යාගාරය සඳහා සුදු යකඩ දොරක් රුපියල් මිලියන 3ක වියදමින් සවිකිරීමට සැලසුම් කර ටෙන්ඩර් කැඳවා සැපයුම්කරුවෙකුට ටෙන්ඩරය ප්‍රදානය කොට ඇති නමුත් ඔහුට මෙම දොර සෑදීමට නොහැකි වීමෙන් එකී ටෙන්ඩරය අවලංගු කර නැවත දෙවනවරට 2024 වසරේ දී ඒ

සඳහා ලංසු කැඳවීම කර ඇත. නමුත් 2025 අප්‍රේල් 30 වනවිටත් එහි වැඩ අවසන් වී නොමැති බව කාරක සභාව නිරීක්ෂණය කළාය.

දැනට පවතින දොර හරහා වාතය ගමන් කිරීමේ ගැටලුව හේතුවෙන් සුදු යකඩ දොරක් සවිකිරීමට තීරණය කර ඇති අතර, එම දොර සවි කරන තෙක් Air Curtains සවි කිරීම හා පිටත කොටස වාතය රහිත කිරීම වැනි තාවකාලික ක්‍රම භාවිතා කරමින් ශල්‍යාගාරය ක්‍රියාත්මක කරන බව කාරක සභාව තවදුරටත් නිරීක්ෂණය කළාය.

මීට වසර දෙකකට පෙර ටෙන්ඩරය ලබාදුන් සැපයුම්කරුට දොර සෑදීමට නොහැකි වීමෙන් එම ටෙන්ඩරය අවලංගු කර නැවත ලංසු කැඳවීමට සිදු වූ බවත්, දැනට මිල ගණන් ඇගයීම් අවසන් අදියරේ පවතින බවත් 2025 ජූනි මාසය ඇතුළත වැඩ අවසන් කිරීමට බලාපොරොත්තු වන බවත් මණ්ඩලයේ අධ්‍යක්ෂ සහ සැපයුම් නිලධාරී සඳහන් කළේය.

2022 වර්ෂයේ සැලසුම් කර තිබූ මෙම අත්‍යවශ්‍ය කාර්යය 2022 සිට 2025 දක්වා වසර 03 ක් ප්‍රමාද වීම සම්බන්ධව සහ මෙම ප්‍රමාදය හේතුවෙන් අමතර වියදමක් දරා තාවකාලික ක්‍රමවේද භාවිතා කිරීම සම්බන්ධව කාරක සභාව අප්‍රසාදය පළ කළාය.

**3.4** **<u>ගිනි ආරක්ෂණ සහ හඳුනා ගැනීමේ පද්ධතිය නැවත ස්ථාපිත කිරීම</u>**

2023 වසරේ රුපියල් මිලියන 30ක වියදමින් ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා මණ්ඩලයේ ගිනි ආරක්ෂණ සහ හඳුනා ගැනීමේ පද්ධතිය නැවත ස්ථාපනය කිරීමට සැලසුම් කළද, එය 2025 අප්‍රේල් 30 වන විටත් ක්‍රියාත්මක කර නොමැති බවත්, මෙම කටයුත්ත 2026 ප්‍රාග්ධන මුදලින් සිදු කිරීමට සැලසුම් කර ඇති බවත් කාරක සභාවට කරුණු අනාවරණය විය.

රෝහලේ පැරණි ගිනි ආරක්ෂණ පද්ධතිය දිරාපත් වී ඇති බවත්, එය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ලංසු කැඳවූ අවස්ථාවේ දී ප්‍රතිසංස්කරණය සංකීර්ණ සහ වියදම් අධික බව පවසා කිසිවෙකුත් ලංසු ඉදිරිපත් නොකළ බවත්, අමාත්‍ය මණ්ඩල අනුමැතියක් අනුව එහි කටයුතු කොටස් වශයෙන් සිදු කිරීමට යෝජනා වී ඇති බවත්, මේ වන විට තාවකාලික ගිනි ආරක්ෂණ

ක්‍රමයක් සවි කර ඇති බවත්, මේ සම්බන්ධයෙන් කෝට්ටේ මහ නගර සභාව සමඟ එක්ව කටයුතු සිදුකරමින් පවතින බවත් රෝහල් මණ්ඩලයේ සැලසුම් නිලධාරියා විසින් කරුණු දක්වන ලදී.

මෙම ව්‍යාපෘතිය සඳහා 2024 වසරේ ක්‍රියාකාරි සැලැස්මේ අංක 43 යටතේ රුපියල් මිලියන 135ක් වෙන් කර ඇති අතර, වගකීම් නිලධාරියා ලෙස රෝහල් අධ්‍යක්ෂවරයා නම් කර තිබුණද, 2025 වසරේ ලැබුණු රුපියල් මිලියන 500ක ප්‍රාග්ධන ප්‍රදානය වෙනත් අත්‍යාවශ්‍ය ව්‍යාපෘති සඳහා ප්‍රමුඛත්වය දීම හේතුවෙන් 2025 වසරේදී මෙම ව්‍යාපෘතිය සඳහා මුදල් වෙන් කිරීමට නොහැකි වූ බැවින් එය 2026 වර්ෂයට යොමු කිරීමට සිදු වූ බවත්, රෝහල් මණ්ඩලය 2024දී ලබාගත් රුපියල් මිලියන 400ක ප්‍රාග්ධන ප්‍රදානයෙන් 9% පමණක් වියදම් කර ඉතිරි 91% මහ භාණ්ඩාගාරයට නැවත හරවා යවා ඇති බවත්, මෙයට ප්‍රධාන හේතුව ලෙස කාර්ය මණ්ඩලයේ පවතින පරිපාලන දුර්වලතාවය පෙන්වා දිය හැකි බවත් මණ්ඩලයේ සභාපතිවරයා පැහැදිලි කළේය.

රෝහලක් සඳහා ගිනි ආරක්ෂණ සහතිකයක් නොතිබීම බරපතල ගැටළුවක් බව කාරක සභාව නිරීක්ෂණය කළාය.

මෙම සියලු කරුණු පිළිබඳව විස්තරාත්මකව සාකච්ඡා කළ කාරක සභාව ඒ සඳහා පහත නිර්දේශ නිකුත් කරන ලදී.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

**I. මෙම කාර්යයන් නිම කිරීම සඳහා මේ වන විට ද දීර්ඝ කාලයක් ගත වී ඇති බැවින් තවදුරටත් ප්‍රමාදවීම් වළක්වා ඉතා කඩිනමින් එකී කාර්යයන් නිම කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.**

**II. යෝජිත ව්‍යාපෘති, ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් කිරීම සහ නිසි කාල රාමුව තුළ සිදු වනවාද යන්න අධීක්ෂණය කිරීම.**

**III.මෙම කාර්යයන් නිම කිරීම ප්‍රමාද වීම සම්බන්ධයෙන් වගකීම් විරහිතව කටයුතු කිරීම පිළිබඳ පරීක්ෂා කිරීම.**

<u>නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>

ලේකම් - සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

සභාපති - ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලය

<u>කාරක සභා නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය</u>

නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය 2025.06.30 වැනි දින තෙක් කාරක සභාවට වාර්තා කර නොමැත.

## 04. <u>2025 වර්ෂයේ ප්‍රාග්ධන වියදම්</u>

මෙම රෝහල් මණ්ඩලයට 2025 වර්ෂය සඳහා රුපියල් මිලියන 500 ක ප්‍රාග්ධන ප්‍රතිපාදන වෙන් වී ඇති බවත්, පළමුවැනි කාර්තුවට රුපියල් මිලියන 100ක් වෙන් කළ බවත්, එම ප්‍රතිපාදන සියල්ල සඳහා ව්‍යාපෘති සැලසුම් කර ඒවායේ වැඩ නිම වීමේ භෞතික ප්‍රගතිය අනුව ගෙවීම් කටයුතු සිදු කරමින් පවතින බවත්, ආසන්න වශයෙන් මේ වන විට රුපියල් මිලියන 48 ක ගෙවීම් සිදු කර ඇති බවත්, තවත් රුපියල් මිලියන 400 ක ප්‍රතිපාදන 2025 වසරට වෙන් වී ඇති බවත්, ඒ සියල්ල රෝහලේ සංවර්ධනය සඳහා යොදා ගැනීමට සැලසුම් කර ඇති බවත්, ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලයේ සභාපතිවරයා ප්‍රකාශ කරන ලදී.

## 05. <u>ප්‍රධාන විධායක නිලධාරි තනතුර සහ වගකීම්</u>

ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලයේ අධ්‍යක්ෂවරයා ප්‍රධාන විධායක නිලධාරියා ද යන්න සම්බන්ධව අපැහැදිලිතාවයක් පැවති බවත්, සමහර අවස්ථාවලදී හිටපු සභාපතිවරයා විසින් අධ්‍යක්ෂවරයා දැනුවත් නොකර, පහළ නිලධාරීන්ට සෘජුවම නියෝග ලබා දීමෙන් යම් ගැටලුකාරී තත්ත්වයක් ඇතිවී තිබුණු බවත් කාරක සභාව නිරීක්ෂණය කළාය.

තවද, ප්‍රධාන විධායක නිලධාරියා කළමනාකරණ කමිටුවේ සභාපතිවරයා වුවද එයට මූලා බලතල නොමැති බවත්, සභාපතිවරයා තමන්ගේ ගණන් දීමේ

නිලධාරියා බවත්, මණ්ඩල අරමුදල පරිපාලනය කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලයට සමස්තයක් ලෙස ඇති බවත් කාරක සභාවට කරුණු අනාවරණය විය.

ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා මණ්ඩලය සංස්ථාපනය කර ඇති 1983 අංක 54 දරන ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා මණ්ඩල පනත මඟින් නිශ්චිතව දක්වා නොමැති නමුදු රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 හි විධිවිධාන ප්‍රකාරව ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා මණ්ඩලයේ අධ්‍යක්ෂවරයා ප්‍රධාන විධායක නිලධාරි (CEO) වන බවත් ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා මණ්ඩලයේ සමස්ත ක්‍රියාකාරිත්වය හා කාර්යසාධනය සම්බන්ධයෙන් වගකීම ද දැරිය යුතු බවද, අධ්‍යක්ෂවරයාගේ පාලනයෙන් බැහැර ප්‍රශ්න සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීමේ වගකීම ඔහු දරන බවද මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් විගණකාධිපතිවරයා විසින් පෙන්වා දෙන ලදී.

**06.** <u>වාර්ෂික වාර්තා සභාගත කිරීම</u>

2022 වාර්ෂික වාර්තාව සම්පූර්ණ කර පාර්ලිමේන්තුවේ සභාගත කර ඇති බවත්, 2023 වාර්තාව සකස් කර අමාත්‍යාංශයට භාර දී ඇති බවත්, 2024 වාර්ෂික වාර්තාවේ භෞතික සහ මූල්‍ය කොටස් සම්පූර්ණ කර ඇති බවත්, විගණකාධිපති වාර්තාව ලැබෙන තෙක් ඉදිරි කටයුතු කළ නොහැකි බවත්, වාර්ෂික වාර්තා සභාගත කිරීම, මුදල් වර්ෂය අවසන් වී ඊළඟ වසරේ මැයි 31 වන විට කළ යුතු බවට රීති ඇති බවත් මේ සම්බන්ධයෙන් කරුණු දක්වමින් ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා මණ්ඩලයේ සැලසුම් නිලධාරිනිය විසින් කරුණු දක්වන ලදී.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

**I. 2023, 2024 වර්ෂවලට අදාළ වාර්ෂික වාර්තා මාස 01 ක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කිරීම.**

**II. ඉදිරියේ දී නිසි කාල සීමාව තුළ වාර්ෂික වාර්තා සභාගත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.**

<u>**නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**</u>
ලේකම් - සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
සභාපති - ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා මණ්ඩලය

<u>**කාරක සභා නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය**</u>
නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය 2025.06.30 වැනි දින තෙක් කාරක සභාවට වාර්තා කර නොමැත.

**07. <u>විගණන විමසුම් සඳහා පිළිතුරු ඉදිරිපත් නොකිරීම</u>**

ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා මණ්ඩලයට අදාළව විගණකාධිපති විසින් නිකුත් කළ විගණන විමසුම්වලින් 2025 අප්‍රේල් 20 දින වනවිට පිළිතුරු ඉදිරිපත් නොකළ විගණන විමසුම් සංඛ්‍යාව 11 ක් බවත්, පිළිතුරු ලබා දීම ප්‍රමාද වීම පිළිබඳ තොරතුරු පහත පරිදි වන බවත්, කාරක සභාව නිරීක්ෂණය කළාය.

| වර්ෂය | විගණන විමසුම් සංඛ්‍යාව | 2025 අප්‍රේල් 30 දිනට ප්‍රමාද කාලය මාස |
|---|---|---|
| 2023 | 04 | 09-11 |
| 2024 | 07 | 01-06 |

විගණන විමසුම් 11කට පිළිතුරු ලබා දී නොමැති අතර, එම පිළිතුරු මේ වන විට සකස් කරමින් පවතින බවත් මැතිවරණ කාලයේ බඳවාගත් සේවකයින් 1129ක් සම්බන්ධ විමසුමට 2025.05.31 දිනට පෙර පිළිතුරු ලබා දීමට කටයුතු කරන බවටත් කාරක සභාවට කරුණු අනාවරණය විය.

මෙම කටයුතුවල ඇති සැලකිය යුතු ප්‍රමාදයන් සහ වගකීම් පැහැර හැරීම් සම්බන්ධව සොයා බැලීමක් සිදු කළ යුතු බවත්, විගණන විමසුම්වලට නිශ්චිත හා නිවැරදි පිළිතුරු නිසි කාලසීමාව තුළ ලබා දිය යුතු බවත් කාරක සභාව අවධාරණය කළාය.

**කාරක සභාවේ නිර්දේශ**

**I.විගණකාධිපතිවරයා විසින් මේ වන විට ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා මණ්ඩලයට නිකුත් කර ඇති සියලුම විගණන විමසුම් සඳහා 2025.05.31 දිනට පිළිතුරු ඉදිරිපත් කිරීම.**

**II. ඉදිරියේදී ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා මණ්ඩලයට විගණකාධිපති විසින් නිකුත් කරන විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමේ දී මෙවැනි පැහැර හැරීම් සහ ප්‍රමාද වීම් සිදු නොවීමට අවශ්‍ය කටයුතු කිරීම**

**නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**

ලේකම් - සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය (නිර්දේශ අංක II)
සභාපති - ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා මණ්ඩලය (නිර්දේශ අංක I සහ II)

**කාරක සභා නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය**

නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය 2025.06.30 වැනි දින තෙක් කාරක සභාවට වාර්තා කර නොමැත.

## 08. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 2022, 2023 සහ 2024 වර්ෂවල පහත පරිදි පවත්වා ඇති බව කාරක සභාව නිරීක්ෂණය කළාය.

| වර්ෂය | පවත්වා ඇති රැස්වීම් ගණන | සෞඛ්‍ය සේවා අධ්‍යක් ජනරාල්වරයාගේ සහභාගිත්වය | පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනයේ අධ්‍යක්ෂග සහභාගිත්වය |
|---|---|---|---|
| 2022 | 07 | සහභාගි වී නැත. | 03 |
| 2023 | 16 | 03 | 02 |
| 2024 | 14 | 07 | 02 |

ඉහත සහභාගිත්වය අනුව සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් හා පශ්චාත් උපාධි ආයතනයෙන් රෝහල වෙත ලැබිය යුතු උපදේශනාත්මක දායකත්වය නිසි ආකාරයෙන් ලැබී නොමැති බව කාරක සභාවට නිරීක්ෂණය විය.

ඉහත සඳහන් සංඛ්‍යාවට වඩා වැඩි වාර ගණනක් ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගයශාලා මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගි වූ බවත්, එම තොරතුරු නැවත පරීක්ෂා කළ යුතු බවත්, තමාට අනෙකුත් රැස්වීම් පැවැත්වෙන දිනටම ශ්‍රී ජයවර්ධනපුර මහරෝගයශාලා මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවති 2023 සහ 2024 වර්ෂවල එයට සහභාගි වීම අවම වීමට එක් හේතුවක් වූ බවත් ඊට අදාළව කරුණු දක්වමින් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා ප්‍රකාශ කළේය.

ඊට අමතරව, දීර්ඝ කාලයක් සිට රැස්වීම් දින වෙනස් කරන ලෙස ඉල්ලා සිටි බවත්, මේ මාසයේ එය වෙනස් කර ඇති බවත්, සහභාගි විය හැකි සෑම රැස්වීමකටම තමා සහභාගි වූ බවත්, පනත අනුව නිලබලයෙන් සම්බන්ධ විය යුතු සාමාජිකයන් වෙනුවට නියෝජිතයන් සහභාගි කරවිය නොහැකි බවත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

කෙසේ වෙතත්, පනත සංශෝධනයේදී මෙම කරුණු අවධානයට ගත යුතු බවත්, නිලබලයෙන් සම්බන්ධ විය යුතු සාමාජිකයන්ගේ සහභාගිත්වය අවම වීම හේතුවෙන් ඔවුන් පත් කිරීමෙන් අපේක්ෂා කරන අරමුණු කරා ළඟාවීමේදී සහ විශේෂයෙන්, අත්‍යවශ්‍ය සාමාජිකයන් නොමැතිව ගන්නා අධ්‍යක්ෂ මණ්ඩල තීරණවල නීත්‍යානුකූලභාවය පිළිබඳවද ගැටලු මතු විය හැකි බවත්, කාරක සභාව නිරීක්ෂණය කළාය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

**I.සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා 2022 වසරේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගි වුයේද යන්න සොයා බලා එම තොරතුරු විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.**

**II.තීන්දු ගැනීමේ ක්‍රියාවලියට අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලු සාමාජිකයන්ට සහභාගී විය හැකි වන ආකාරයට අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සංවිධානය කිරීම.**

**III.අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ සහභාගිත්වය පිළිබඳ නිවැරදි වාර්තා තබා ගැනීම.**

**IV.අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා අත්සන් කිරීමේ දී එම රැස්වීම්වලදී සාකච්ඡා කළ කරුණු හා නිවැරදි සත්‍ය තොරතුරු නිවැරදිව වාර්තාවන්හි ඇතුළත් වන්නේ ද යන්න පරීක්ෂා කර බැලීමෙන් අනතුරුව අත්සන් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය, වගබලා ගැනීම.**

<u>නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>
සභාපති - ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලය (නිර්දේශ අංක I,II, III සහ IV)
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් - ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලය (නිර්දේශ අංක I)
අධ්‍යක්ෂ මණ්ඩලය- ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලය (නිර්දේශ අංක IV)

<u>කාරක සභා නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය</u>
නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය 2025.06.30 වැනි දින තෙක් කාරක සභාවට වාර්තා කර නොමැත.

**09.** **<u>කාර්ය මණ්ඩලය සංයුතිය</u>**

ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලයට අනුමත කාර්යය මණ්ඩලය පහත පරිදි වේ.

| සේවක කාණ්ඩය | 2024 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව | | |
|---|---|---|---|
| | අනුමත | තථ්‍ය | පුරප්පාඩු |
| විධායක | 23 | 17 | 06 |
| විශේෂඥ වෛද්‍යවරු | 50 | 44 | 06 |
| නේවාසික විශේෂඥ වෛද්‍යවරු | 10 | 01 | 09 |
| වෛද්‍ය නිලධාරීන් | 180 | 120 | 60 |
| පරිපූරක වෛද්‍ය නිලධාරීන් | 137 | 96 | 41 |
| හෙද කාර්ය මණ්ඩලය | 880 | 676 | 204 |
| ලිපිකරු හා සහයක සේවා | 152 | 103 | 49 |
| වෙනත් කාර්ය මණ්ඩලය | 124 | 94 | 30 |
| ප්‍රාථමික කාර්ය මණ්ඩලය | 493 | 371 | 122 |
| **එකතුව** | **<u>2049</u>** | **<u>1522</u>** | **<u>527</u>** |

රෝහලට අනුමත වෛද්‍ය නිලධාරි කාර්ය මණ්ඩලය 180ක් වන අතර, එයින් ස්ථිර පදනමින් වෛද්‍යවරු 121දෙනෙකු, ද්විතියන පදනම මත 24දෙනෙකු, කොන්ත්‍රාත් පදනමින් 38දෙනෙකු වශයෙන් වෛද්‍ය නිලධාරින් 183ක් සේවය කරන බවත්, ඒ අනුව වෛද්‍ය නිලධාරීන් තිදෙනෙකුගේ අතිරික්තයක් ද

පවතින බවත් 2025 අප්‍රේල් මාසයේ කාර්ය මණ්ඩල තොරතුරු අනුව නිරීක්ෂණය විය.

මෙම දත්ත සටහන ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා මණ්ඩලයට අනුමත ස්ථිර කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පමණක් ඇතුළත් කොට සකස් කර ඇති බවටද සභාපතිවරයා ප්‍රකාශ කළේය.

**10.** **<u>කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව තනතුරු සඳහා බඳවා ගැනීම</u>**

2024 දෙසැම්බර් 31 දින වන විට තනතුරු වර්ග දෙකක් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව අනුමත තනතුරු සංඛ්‍යාව ඉක්මවා නිලධාරින් 208 දෙනෙකු හා අනුමත කාර්ය මණ්ඩලය තුළ නොවූ තනතුරු වර්ග දෙකක් සඳහා පහත පරිදි නිලධාරින් 140 දෙනෙකු බඳවාගෙන ඇති බව කාරක සභාව නිරීක්ෂණය කළාය.

| **සේවා කාණ්ඩය** | **තනතුර** | **අනුමත** | **තථ්‍ය** | **අනුමත නොවූ** | **අනුමත ප්‍රමාණය ඉක්මවීම්** |
|---|---|---|---|---|---|
| ලිපිකරු හා සහයක සේවා | කළමනාකරණ සහකාර (MA 1-1) | - | 47 | 47 | - |
| වෙනත් කාර්යමණ්ඩලය | පුහුණු ශ්‍රමිකයන් | 25 | 30 | - | 05 |
| ප්‍රාථමික කාර්යමණ්ඩලය | ශ්‍රමික (SKS) | 50 | 253 | - | 203 |
| | සෞඛ්‍ය කාර්ය සහයක | - | 93 | | - |
| එකතුව | | | | <u>140</u> | <u>208</u> |

මෙම රෝහල ආරම්භ කිරීමේ දී ඕඩර්ලි (Orderly) තනතුර පැවති බවත්, පසුව සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදෙස් මත ඊට සමගාමී උපස්ථායක තනතුර ඇති කරන ලද බවත්, ඒ අනුව 2024 වසරේ දී ඕඩර්ලි (Orderly) තනතුරු සියල්ල සෞඛ්‍ය කාර්යය සහායක තනතුරුවලට අන්තර්ග්‍රහණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් ගත් බවත් ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලයේ අධ්‍යක්ෂවරයා ඉදිරිපත් කළ තොරතුරු අනුව නිරීක්ෂණය විය.

හිටපු සෞඛ්‍ය අමාත්‍ය වෛද්‍ය රමේෂ් පතිරණ මහතා, හිටපු සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍ය විශේෂඥ වෛද්‍ය සීතා අරඹෑපොළ මහත්මිය, පී.ජී. මහීපාල මහතා, වෛද්‍ය අසේල ගුණවර්ධන මහතා, වෛද්‍ය සුනිල් ද අල්විස් මහතා සහ සුනිල් ගලගම මහතා යන කණ්ඩායම සෞඛ්‍ය අමාත්‍යාංශය නියෝජනය කරමින් ද, ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලයේ හිටපු සභාපති වෛද්‍ය සාරංග අලහප්පෙරුම මහතා, වෛද්‍ය රත්නසිරි ඒ. හේවගේ මහතා, වෛද්‍ය සී.කාරියවසම් මහතා, වෛද්‍ය සංජීවණී රාජසිංහ මහත්මිය, වෛද්‍ය රාජිත සිල්වා මහතා, වෛද්‍ය ජීවනී රාජසිංහ මහත්මිය, සියලුම අංශ ප්‍රධානීන් සහ ලියාපදිංචි වෘත්තීය සංගම් නියෝජිතයන්ගේ සහභාගිත්වයෙන් වත්මන් තත්ත්වය සහ අනාගත සැලසුම් පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා 2024.06.27 දින සෞඛ්‍ය අමාත්‍යාංශයේ දී පවත්වන ලද සාකච්ඡාවේ සටහන් පහත පරිදි කාරක සභාවේ අවධානයට ලක් විය.

රෝහලට පසුගිය වසර පහ තුළ රෝගීන් ඇතුළත් වීමේ ප්‍රතිශතය සහ ඇඳන් භාවිතා කිරීමේ අනුපාතය ආදිය පිළිබඳව මෙම සාකච්ඡාවේ දී ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලයේ හිටපු සභාපති විසින්, ඉදිරිපත් කිරීමක් කළ (Power Point Presentation) බවත් එහිදී 'රෝගීන්ට දැරිය හැකි මිලකට හොඳම සෞඛ්‍ය සේවා සපයන්නා බවට පත්වීම' යන්න ශ්‍රී ජයවර්ධනපුර මහරෝගාශාලා මණ්ඩලයේ තේමාව විය යුතු බවටත් යෝජනා කර තිබුණි.

තවද එම සාකච්ඡාවට අදාළ සාකච්ඡා සටහනේ, ''කාර්ය මණ්ඩල හිඟය පිළිබඳව විවිධ චක්‍රලේඛ හේතුවෙන් රෝහල් සේවාව අඛණ්ඩව හා විධිමත්ව රජයට වාසිදායක වන ආකාරයට පවත්වාගෙන යාමට නොහැකි තත්ත්වයකට පත්වී ඇති අතර, ඒ ගැන සලකා බලා සෞඛ්‍ය අමාත්‍යතුමා, රාජ්‍ය අමාත්‍යතුමිය සහ සෞඛ්‍ය ලේකම් රෝහලේ දැනට ඇති පුරප්පාඩු සියල්ලටම සුදුසුකම් සහිත පුද්ගලයන් බඳවා ගැනීමට අනුමත කරන ලදී.'' යනුවෙන් සඳහන්ව ඇති

බවත්, මෙය ඉතා බරපතළ ලෙස සැලකිය යුතු ප්‍රකාශයක් බවත් කාරක සභාව නිරීක්ෂණය කළාය.

ඒ අනුව ඒ සම්බන්ධයෙන් අදාළ නිලධාරින්ගෙන් කළ කරුණු විමසීමේ දී පහත කරුණු අනාවරණය විය.

- ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරිය එම රැස්වීමට සහභාගී වී නොමැති බව,

- තවද, මෙවැනි කරුණු රැස්වීමේදී සාකච්ඡා වූ බවට අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ මතකයේ නොමැති බව,

- සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා එම රැස්වීමට සහභාගී වූ නමුත් “විවිධ චක්‍රලේඛ හේතුවෙන් රෝහල් සේවාව අඛණ්ඩව හා විධිමත්ව රජයට වාසිදායක ලෙස පවත්වා ගැනීමට නොහැකි තත්ත්වයකට පත්වී ඇත” යන ප්‍රකාශයට ඔහු එකඟ නොවන බව,

- විවිධ අවශ්‍යතා අනුව කාලානුරූපීව චක්‍රලේඛ නිකුත් කර, නිරන්තරයෙන් යාවත්කාලීන කරමින් ක්‍රියාත්මක වන බවත්, ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලය විශේෂිත ක්‍රමවේදයක් අනුව අධ්‍යක්ෂ මණ්ඩලයකින් පාලනය වන බැවින් සමහර චක්‍රලේඛ රෝහලට සෘජුවම අදාළ නොවන බව,

මෙවැනි ප්‍රකාශයක් රැස්වීම් වාර්තාවකට ඇතුළත් කිරීමට ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලය තම රෝහල රජයට වාසිදායක ලෙස පවත්වා ගෙන යාමට පවතින බාධා ප්‍රථමයෙන් හඳුනා ගෙන තිබිය යුතු බව කාරක සභාව නිරීක්ෂණය කළාය.

- ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලයට බාධාකාරී වන චක්‍රලේඛ හඳුනාගෙන නොතිබූ බවත්, මෙම රැස්වීම එදින ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලයේ එවකට සභාපතිවරයා විසින් සිදු කළ ඉදිරිපත්

කිරීමක් (Power Point Presentation) පදනම් කර ගනිමින් පැවති බවත්, එම ඉදිරිපත් කිරීමේ දී ද එවැනි චක්‍රලේඛ ගැන සඳහනක් නොතිබුණු බවත්, එහිදී මෙවැනි කරුණක් සාකච්ඡා වූ බවට තම මතකයේ නොමැති බවත් මේ සම්බන්ධයෙන් කරුණු දක්වමින් ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා මණ්ඩලයේ අධ්‍යක්ෂවරයා ප්‍රකාශ කළේය.

➢ ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා මණ්ඩලයේ ක්‍රියාකාරිත්වයට බාධා පමුණුවන චක්‍රලේඛ හඳුනා ගෙන නොමැතිව මෙවැනි ප්‍රකාශයක් ඇතුළත් රැස්වීම් වාර්තාවකට අත්සන් කිරීම පිළිබඳව කාරක සභාව අප්‍රසාදය පළ කළාය.

2024.06.27 දින පැවති රැස්වීමට අදාළ වාර්තාවේ පහත කරුණු සඳහන්ව ඇත.

➢ ‘සෞඛ්‍ය අමාත්‍යතුමා, රාජ්‍ය අමාත්‍යතුමිය සහ සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් දැනට රෝහලේ පවතින සියලුම පුරප්පාඩු සඳහා සුදුසුකම් සහිත පුද්ගලයන් බඳවා ගැනීමට අනුමත කරනු ලැබිය.’

➢ ‘ඒ අනුව අත්‍යවශ්‍ය සේවා අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා සෞඛ්‍ය කාර්ය සහයක, කළමනාකරණ සහකාර සහ රියදුරු යන තනතුරු සඳහා දැනට සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ලැබී ඇති අයදුම්පත්‍රවලින් සම්මුඛ පරීක්ෂණයක් හරහා සුදුසුකම්ලත් අය බඳවා ගැනීමටත්, අනෙකුත් තනතුරු සඳහා සාමාන්‍ය පරිදි අයදුම්පත්‍ර කැඳවා සුදුසුකම් සහිත පුද්ගලයන් බඳවා ගැනීමටත් අනුමතිය ලබා දෙන ලදි.’

➢ ‘සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පවතින තනතුරු සංකීර්ණ නිසාත් ශ්‍රී ජයවර්ධනපුර මහරෝහල රාජ්‍ය ව්‍යවසායක් නිසාත් එහි විවිධ ශ්‍රේණීන් බහුතරයක් ඇති නිසාත් වෘත්තීමය ගැටලු ඇතිවෙන බවත්, එම නිසා අනෙකුත් රාජ්‍ය ව්‍යවසායන්ට සමගාමීව මෙහි අභ්‍යන්තර ක්‍රියාවලිය ඉතාමත් සරල විය යුතු බවත් ප්‍රකාශ කරන ලදී’

➢ ‘ඒ අනුව සෞඛ්‍ය අමාත්‍යාංශය හා සමාන තනතුරු එනම් විශේෂඥ වෛද්‍ය, වෛද්‍ය, හෙද නිලධාරි, අතුරු වෛද්‍ය සහ පරිපූරක වෛද්‍ය හැර අනෙකුත්

සියලු වෛද්‍ය නොවන තනතුරු රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමත වැටුප් කේත දෙකකට බඳවා ගැනීමට තීරණය විය'

- 'ඔඩර්ලි, රසායනාගාර ලිපිකරු, සෞඛ්‍ය කාර්ය සහයක යන තනතුරු සියල්ල සෞඛ්‍ය කාර්ය සහායක PL-1 තනතුරටත්, වාට්ටු ලිපිකරු, ලිපිකරු මුදල් අයකැමි, විගණන සහායක, ගිණුම් සහායක, පිළිගැනීමේ නිලධාරි යන තනතුරු කළමනාකරණ සහකාර MA I-I තනතුරටත් වන පරිදි, එකම කාණ්ඩයකට බඳවා ගැනීම කළ යුතු බව තීරණය විය'

- 'එසේම මෙය අලුතෙන් බඳවා ගන්නා තනතුරුවලට පමණක් අදාළ වන අතර දැනට පවතින තනතුරුවලට බලැපෑමක් නොවන බවත් මෙහිදී සඳහන් කරන ලදි.'

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MH/AD/01/O8/SJGH හා 2024.11.12 දිනැති ලිපිය මඟින් යොමු කරන ලද ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගයශාලා මණ්ඩලයේ සභාපතිගේ අංක SJ/ED/AO/2024 හා 2024.10.30 දිනැති ලිපියට පිළිතුරු ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත 'කාර්ය මණ්ඩල බඳවා ගැනීම ශ්‍රී ජයවර්ධනපුර මහරෝහල' යන මාතෘකාව යටතේ 2025.05.02 වැනි දිනැති ලිපිය මඟින් පහත කරුණු පෙන්වා දී ඇති බව කාරක සභාව නිරීක්ෂණය කළාය.

- මෙම බඳවා ගැනීම් සිදු කිරීමට අදාළව රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සඳහා පත්කර තිබූ අග්‍රාමාත්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පත් කළ කමිටුවේ අනුමැතිය ලබාගෙන නොමැති බව,

- පුරප්පාඩු සම්පූර්ණ කිරීම වෙනුවෙන් අනුමැතිය ලබා ගැනීමෙන් පසුව අදාළ පුරප්පාඩු සංඛ්‍යාව නිශ්චිතව සඳහන් කරමින් බඳවා ගැනීමට අදාළව ප්‍රසිද්ධ දැන්වීම් පළ කර අයදුම්පත් කැඳවා බඳවා ගැනීම සිදු කළ යුතු නමුදු එසේ කර නොතිබීම,

➢ සෞඛ්‍ය අමාත්‍යාශය වෙත ලැබී ඇති අයදුම්පත් අතරින් සම්මුඛ පරීක්ෂණයක් හරහා සුදුසුකම් ලද පුද්ගලයන් සෞඛ්‍ය කාර්ය සහායක, කළමනාකරණ සහකාර සහ රියදුරු යන තනතුරු සඳහා තෝරා ගැනීම පිළිගත් ක්‍රමවේදයක් නොවන බව,

➢ ශ්‍රී ජයවර්ධනපුර මහරෝහල සඳහා අනන්‍ය වූ බඳවා ගැනීම් පටිපාටියක් අනුමත කරන තෙක් සෞඛ්‍ය අමාත්‍යංශයේ සමාන්තර තනතුරු සඳහා අනුමත බඳවා ගැනීමේ පටිපාටි පරිදි කටයුතු කළ යුතු බවට, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/1758/Jaya.H/2018 හා 2018.06.11 දිනැති ලිපියෙන් දැනුවත් කර ඇතත් ඒ පිළිබඳව අවධානය යොමු කර නොමැති බව,

➢ ශ්‍රී ජයවර්ධනපුර රෝහල රාජ්‍ය ව්‍යවසායක් ලෙස සලකා ඒ සඳහා අනුමත වැටුප් කේත යටතේ ඉහත තනතුරු සඳහා බඳවා ගැනීමට 2024.06.28 දිනැති අංක 483:12:2 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මඟින් අනුමැතිය හිමිව ඇතත්, රෝහල සඳහා එම අවස්ථාවේ අනුමතව ඇත්තේ රාජ්‍ය සේවයේ වැටුප් ක්‍රමවේදයම බැවින් ව්‍යවසායක් ලෙස සලකා කටයුතු කිරීමට පෙර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් අදාළ සංශෝධනයන් සිදු කළ යුතු වුවද එසේ සිදු කර නොමැති බව සහ තනතුරු නාම සංශෝධනය කිරීමට ද අනුමැතිය ලබා ගෙන නොමැති බව,

➢ 2024.06.28 දිනැති අංක 483:12:2 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව 1996.07.01 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි වැටුපෙන් 35 %ක ප්‍රමාණයක් නිලධාරින්ගේ වැටුපට එකතු කිරීමට තීරණය කර ඇතත්, අදාළ අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබාදී ඇත්තේ සෞඛ්‍ය අමාත්‍යංශය හෝ රජයේ දෙපාර්තමේන්තුවල සමාන්තර ශ්‍රේණිවල වැටුප සඳහා යොදා ගැනීමට වුවද එය සාවද්‍ය ලෙස අර්ථ නිරූපණය කර අධ්‍යක්ෂ මණ්ඩලය නිවැරදි නොවන තීරණයකට එළැඹ ඇති බව,

➢ කළමනාකරණ සහකාර සේවකයින් අන්තර්ග්‍රහණය කිරීමේ ගැටලුවට අවධානය යොමු කර නොමැති බව,

➢ 2024.07.26 දිනැති මැතිවරණ කොමිෂන් සභා චක්‍ර ලේඛ අංක 05ට අනුකූල නොවන ලෙස 2024.07.30 දින පත්වීම් ලබා දී ඇති බව,

මෙම සියලු කරුණු සලකා බලා ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා මණ්ඩලය විසින් කළමනාකරණ සහකාර 48, රියදුරු 06 ක් සහ සෞඛ්‍ය කාර්යය සහායක 95 ක් ආදී ලෙස කාර්ය මණ්ඩලය 149 දෙනෙකු බඳවා ගැනීමේ දී අනුගමනය කළ යුතු විධිමත් ක්‍රමවේදය සහ නිසි පටිපාටි අනුගමනය කර නොමැති බව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දන්වා ඇති බව කාරක සභාව නිරීක්ෂණය කළාය.

මෙම බඳවා ගැනීමේ ක්‍රමවේදය (පවතින අයදුම්පත්වලින් සම්මුඛ පරීක්ෂණ මඟින් තෝරා ගැනීම) පිළිගත් ක්‍රමවේදය නොවන බවත්, එය ප්‍රසිද්ධ දැන්වීම් පළකර අයදුම්පත් කැඳවා සිදු කළ යුතුව තිබූ බවත්, මෙම ක්‍රමය පිළිගත නොහැකි බවත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් පැහැදිලිව දක්වා තිබුණි.

සෞඛ්‍ය අමාත්‍යාංශයේ එවැනි අයදුම්පත් තොගයක් නොතිබූ බවද කාරක සභාවට නිරීක්ෂණය විය.

ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා මණ්ඩලයේ ප්‍රධාන ගණකාධිකාරීවරයා සිදු කළ පැහැදිලි කිරීමට අනුව ඔහු 2024 වර්ෂයේ දෙසැම්බර් මාසයේ රාජකාරි භාර ගැනීමට පෙර සිටම මෙම බඳවා ගත් 149 දෙනාට මාස කිහිපයක් වැටුප් ගෙවා ඇති බවත්, එවකට පැවති අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හා අධ්‍යක්ෂවරයා විසින් ලබා දී තිබූ පත්වීම් මත, ඒවා ප්‍රතික්ෂේප කිරීමට අපහසු තත්ත්වය යටතේ මෙම අනුමත නොකළ තනතුරු සඳහා වැටුප් ගෙවා තිබෙන බවට කාරක සභාවට අනාවරණය විය.

මෙම සාකච්ඡා සටහන් කූට ලේඛනයක් බව පවසමින් එම රැස්වීමට සහභාගී වූ වෘත්තීය සමිති නියෝජිතයන් විසින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පැමිණිලි කර ඇති බව කාරක සභාව නිරීක්ෂණය කළාය.

ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ගේ කරුණු දැක්වීමට අනුව මෙම රැස්වීම් සටහන සකස් කරන සමයේ ඇය අසනීප නිවාඩු ලබා ගෙන සිටි බැවින් එම කාලයේ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරිය ලෙස කළමනාකරණ සහකාර හද්‍රා රණසිංහ මහත්මිය කටයුතු කොට තිබුණි.

මැතිවරණයෙන් පසු අධ්‍යක්ෂ මණ්ඩලය විසුරුවා හැරීමෙන් අනතුරුව අනුමැතියකින් තොරව බඳවා ගැනීමට සැලසුම් කර තිබූ තවත් මෙවැනි තනතුරු 47ක් සඳහා බඳවා ගැනීම අත්හිටවූ බවත්, අධ්‍යක්ෂ මණ්ඩල තීරණ හා හිටපු සභාපතිවරයාගේ ක්‍රියාකලාපය යටතේ මීට පෙර සිදුවූ ක්‍රියාවලින් නැවැත්වීමට අපහසුතා පැවති බවට ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලයේ අධ්‍යක්ෂවරයා විසින් කරුණු දක්වන ලදී.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

**I.මෙම සම්පූර්ණ ක්‍රියාවලිය පිළිබඳ විධිමත් පරීක්ෂණයක් පවත්වා වගකිවයුතු සියලු නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීම සහ ගනු ලැබූ විනය ක්‍රියාමාර්ග පිළිබඳව වාර්තාවක් කාරක සභාවට සහ විගණකාධිපතිට ඉදිරිපත් කිරීම.**

**II.මූලික පරීක්ෂණ මණ්ඩල, විධිමත් විනය පරීක්ෂණ මණ්ඩල සහ මුදල් රෙගුලාසි 104 (1) යටතේ පරීක්ෂණ සිදු කිරීමට අදාළව පරීක්ෂණ මණ්ඩල පත් කිරීමේ දී වගකීම් සහගත, දැනුම සහ පළපුරුද්ද ඇති නිලධාරීන් පත් කිරීම සහ පරීක්ෂණ වාර්තා පදනම් කොට ගෙන වගකිව යුතු නිලධාරීන්ට ලබා දී ඇති දඬුවම සහ සිදු කර ඇති වරද පිළිබඳව සලකා බැලීම.**

**III.ඉහත සඳහන් බඳවා ගැනීම්වලට අදාළව 2024.06.27 වන දින සෞඛ්‍ය අමාත්‍යාංශයේ දී පැවති සාකච්ඡාවේ සටහන සකස් කළේ කවුරුන්ද?, එහි ඇතුළත් කරුණු පිළිබඳව ඊට සහභාගී වූ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් එම රැස්වීමේ දී සාකච්ඡා කළ කරුණු සහ මෙහි අන්තර්ගත කරුණු සම්බන්ධයෙන් පරස්පරතා, එකඟවිය නොහැකි කරුණු පවතින්නේ ද යන්නත්, එහි අන්තර්ගත**

**කරුණුවල සත්‍ය අසත්‍යතාව සහ ලේඛනයේ සත්‍ය අසත්‍යභාවය පිළිබඳවත් කරුණු සොයා බලා ඒ පිළිබඳව වාර්තාවක් කාරක සභාවට සහ විගණකාධිපතිට ඉදිරිපත් කිරීම.**

<u>**නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**</u>

ලේකම් - සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

<u>**කාරක සභා නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය**</u>

නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය 2025.06.30 වැනි දින තෙක් කාරක සභාවට වාර්තා කර නොමැත.

## 11. <u>Laundry Supervisor තනතුර</u>

ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලය තුළ සිදුව ඇති නීති විරෝධී බඳවා ගැනීම් සඳහා වැටුප් ගෙවා ඇති නමුදු, ලොන්ඩරි සුපර්වයිසර් තනතුර සඳහා නීත්‍යානුකූලව බඳවා ගත් සේවකයෙක් සඳහා මාස පහක් වැනි කාලයක් පුරා වැටුප් ගෙවා නොමැති බවත්, මෙම නිලධාරියා රෝහලට තම සේවය සපයා ඇති බවත්, ඇඟිලි සලකුණු යන්ත්‍රයේ දිනපතා පැමිණීම සටහන් කර, බිල්පත් ගෙවීම් නිර්දේශ කිරීම් සඳහා අත්සන් තබා ඇති බවත්, සේවක මණ්ඩලයට රෝහලෙන් නොමිලේ ලබා දෙන ඖෂධ පහසුකමද භුක්තිවිඳ ඇති බවත්, කාරක සභාව නිරීක්ෂණය කළාය.

ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලයේ සභාපතිවරයාගේ කරුණු දැක්වීම අනුව මෙහි සඳහන් ලොන්ඩරි සුපර්වයිසර් තනතුර ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලයට අයත් තනතුරක් වුවද, ඒ සඳහා බඳවා ගැනීමක් සිදු කර නොමැති බවත්, මෙම බඳවා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියක් ලබාගෙන නොමැති බවත්, 2024 නොවැම්බර් මාසයේදී ශ්‍රී ජයවර්ධනපුර මහරෝගාශාලා මණ්ඩලයේ සියලු බඳවා ගැනීම් පරීක්ෂා කිරීම සඳහා පැවති අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු රැස්වීමකදී මෙම තත්ත්වය හෙළි වී තිබෙන බව කාරක සභාවට නිරීක්ෂණය විය.

එසේම, රෝහලට අවශ්‍ය ලොන්ඩරි සේවාවන් බාහිර සැපයුම්කරුවන්ගෙන් ලබා ගැනීම හේතුවෙන් එම තනතුර අවශ්‍ය නොවන තනතුරක් බවට පත් වී ඇති බවත්, මේ සම්බන්ධව කම්කරු අධිකරණය විසින් නිකුත් කළ නියෝගයේ සඳහන් පරිදි, සේවය ලබාගත් කාලයට වැටුප් ගෙවා අදාළ පුද්ගලයාගේ සේවය හැකි ඉක්මනින් අවසන් කිරීමට කටයුතු කරමින් සිටින බවත් කාරක සභාවට නිරීක්ෂණය විය.

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියකින් තොරව කිසිදු තනතුරක් සඳහා බඳවා ගත නොහැකි බවත්, ආයතනයට අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් තනතුරකට වුව ද අලුතින් බඳවා ගැනීමට අනුමැතිය අවශ්‍ය බවත් එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරිය අවධාරණය කළාය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

**I. කැඳවීමේ ලිපියක් ලබා දී ආයතනයේ සේවකයකු ලෙස සේවය සපයනු ලබන මෙම සේවකයාගේ සේවය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව මාස 01 ක් තුළ කාරක සභාවට සහ විගණකාධිපතිට දැනුම් දීම.**

<u>නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>

සභාපති - ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලය

<u>කාරක සභා නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය</u>

නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය 2025.06.30 වැනි දින තෙක් කාරක සභාවට වාර්තා කර නොමැත.

## 12. <u>ආයතනයේ මූල්‍ය අක්‍රමිකතා සහ අලාභ ලැබීම</u>

මානව සම්පත් කළමනාකරණය, වත්කම් කළමනාකරණය, ආදායම් කළමනාකරණය සහ මූල්‍ය කළමනාකරණය යන සියලු අංශවලට අදාළව ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලයේ සමස්ත ක්‍රියාවලියම අවිධිමත් බවත්, පසුගිය වසර පහක කාලය තුළ රෝහල අඛණ්ඩව අලාභ ලබා ඇති බවත්, ප්‍රධාන වශයෙන් නීති විරෝධී පත් කිරීම් සහ අනීතික ගෙවීම් හේතුවෙන්

විශාල මූල්‍ය අලාභයක් සිදුව ඇති බවත්, භාණ්ඩාගාරයෙන් ලැබෙන මුදල් එකී පත්වීම්ලාභීන්ට වැටුප් ගෙවීම සඳහා අවභාවිතා වන ආකාරය මෙයින් පැහැදිලි වන බවත්, විගණකාධිපති විසින් පෙන්වා දෙන ලදී.

## 13. <u>දීමනා ගෙවීම්වල අක්‍රමිකතා සහ බඳවා ගැනීම් පටිපාටි</u>

ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාවේ නිලධාරීන්ට කර ඇති අනීතික ගෙවීම් සම්බන්ධයෙන් කාරක සභාවට නිරීක්ෂණය විය. 2021 ජූලි 28 සිට 2024 ජූලි 15 දක්වා කාලසීමාව තුළ පුරප්පාඩුවක් හේතුවෙන් වැඩ ආවරණය කිරීමේ පදනම මත නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු පත් කර ඇති අතර, එම නිලධාරියට නිත්‍ය තනතුරේ වැටුප් හා දීමනා, වැඩ ආවරණය කිරීමේ දීමනා, අමතර රාජකාරී දීමනා සහ ඉන්ධන දීමනා ඇතුළුව විශාල මුදලක් ගෙවා ඇති බව කාරක සභාවට නිරීක්ෂණය විය. ආයතන සංග්‍රහයේ 13.7 වගන්තියට අනුව වැඩ ආවරණය සඳහා පත් කරන ලද නිලධාරියෙකුට අතිරේක දීමනා ලබාදීම නීතිවිරෝධී වන අතර, එම ප්‍රතිපාදනයට පටහැනිව වැඩ ආවරණය කිරීම සඳහා වැටුපෙන් ¼ ක දීමනාවක් ගෙවා ඇති බව කාරක සභාවට නිරීක්ෂණය විය.

තවද, රාජ්‍ය සේවයේ සමාන්තර තනතුරු සඳහා පමණක් අමාත්‍ය මණ්ඩල තීරණයකින් අනුමත කළ 35%ක දීමනාවක්ද විශ්‍රාම වැටුපක් නොමැති වීම හේතුවෙන් ශ්‍රී ජයවර්ධනපුර මහරෝග්‍යශාලා මණ්ඩලයේ සියලුම තනතුරු සඳහා ද මෙම 35% දීමනාව ලබා දී ඇති අතර, එයද අනීතික බව සභාවට නිරීක්ෂණය විය.

මෙම නීතිවිරෝධී ගෙවීම් හේතුවෙන් 2022 දී රුපියල් මිලියන 162.47ක් සහ 2023 දී මිලියන 158කට අධික මුදලක් අතිරේකව ගෙවා ඇති බවද කාරක සභාවට නිරීක්ෂණය විය. මෙම වියදම් විධිමත් කළහොත්, ආයතනය භාණ්ඩාගාර ප්‍රතිපාදන නොමැතිවද ක්‍රියාත්මක කළ හැකි බව කාරක සභාවට නිරීක්ෂණය වූ අතර, විධිමත් බඳවා ගැනීම් පටිපාටි (SoR) නොමැතිවීම මෙම ගැටළු ඇතිවීමට එක් ප්‍රධාන හේතුවක් වන බව ද නිරීක්ෂණය විය. එම පටිපාටි සකස් කර 2025 ජනවාරි මාසයේදී සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති බවට කාරක සභාවට අනාවරණය විය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

I. ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා මණ්ඩලයේ මූල්‍ය පාලනයේ අක්‍රමවත් බව පරිපාලන දූර්වලතා සහ රෝහලේ උන්නතියට හේතු නොවන සියලුම තත්ත්ව පිළිබඳ විධිමත් පරීක්ෂණයක් පැවැත්වීම.

II. ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා මණ්ඩලයේ අදාළ සියලුම තනතුරු සඳහා බඳවා ගැනීම් පටිපාටි තිබේද යන්න පරීක්ෂා කර එසේ නොමැති තනතුරු සඳහා බඳවා ගැනීම් පටිපාටි සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීම.

III. සියලුම අනීතික ගෙවීම් සම්බන්ධයෙන් පරීක්ෂා කර ඒවා නිවැරදි කිරීමට කටයුතු කිරීම.

IV. මෙම ආයතනයේ සේවකයන්ගේ පත්වීම් ලබා දීම, නිසි අයුරින් අනුයුක්ත කිරීම, වැටුප් ගෙවීම යන සමස්ත ක්‍රියාවලිය සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදු කිරීම.

V. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමතියකින් තොරව බඳවා ගත් තනතුරු සම්බන්ධයෙන් විධිමත්ව සහ නිවැරදිව කඩිනමින් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීම.

VI. ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා මණ්ඩලයේ සේවකයින්ට නීත්‍යානුකූලව හිමිකම් නොලබන දීමනා ගෙවා ඇත්නම් ඒ පිළිබඳව සොයා බලා ඒවා නැවත අයකර ගැනීමට කටයුතු කිරීම.

VII. ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා මණ්ඩලයේ වැටුප් ගෙවීමේදී අනුගමනය කරනු ලබන ආකෘතිවල විෂමතා ඉවත් කර සමස්ත කාර්ය මණ්ඩලයට සමාන ආකෘතියක් යොදා ගැනීම.

**VIII. සේවකයන්ගෙන් අය කළ යුතු අයකිරීම් අය නොකිරීම සම්බන්ධයෙන් සොයා බලා ඒවා අයකර ගැනීමට කටයුතු කිරීම.**

**මෙම සියලු කටයුතු සම්බන්ධව සවිස්තරාත්මක වාර්තාවක් මාස 02 ක් තුළ කාරක සභාවට විගණකාධිපතිට පිටපත් සහිතව ඉදිරිපත් කිරීම.**

**IX. ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා මණ්ඩලය විසින් සකස් කර යොමු කර ඇති තනතුරු සඳහා නිවැරදි පටිපාටි මාස 02 ක් තුළ අනුමත කර දීම.**

<u>**නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**</u>

ලේකම් - සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය (නිර්දේශ අංක I සිට IX)
අධ්‍යක්ෂ ජනරාල් - කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ (නිර්දේශ අංක IX)

<u>**කාරක සභා නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය**</u>

නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය 2025.06.30 වැනි දින තෙක් කාරක සභාවට වාර්තා කර නොමැත.

**14. <u>රෝහලේ කාර්ය සාධනය සහ කාර්ය මණ්ඩල ප්‍රමාණය</u>**

නේවාසික රෝගීන් 300-500 ත් අතර සංඛ්‍යාවක් දිනපතා රෝහලෙන් ප්‍රතිකාර ලබන බවත්, රසායනාගාර හා එක්ස්රේ වැනි වෙනත් සේවාවන් සඳහා ද විශාල රෝගීන් සංඛ්‍යාවක් පැමිණෙන බවත්, සාමාන්‍යයෙන් වසරකට සායනික රෝගීන් 178,000කට පමණ ප්‍රතිකාර කරන බවත් ඇඳන් පිරී ඇති ප්‍රතිශතය (Bed Occupancy Rate) සාමාන්‍ය ඇඳන් සැලකීමේ දී අඩු අගයක් ගත්තද විශේෂ/ගෙවන වාට්ටු (Special/Paying Wards) වල එය ඉහළ මට්ටමක පවතින බවත් මෙහිදී අනාවරණය විය.

ඉහත කී කරුණු අනුව බාහිර රෝගී අංශය (Outpatient Department) සහ ඇතුළත් කිරීමේ සංඛ්‍යාවන් පමණක් පදනම්ව අඩු රෝගි සංඛ්‍යාවකට සේවය

කරන බවට අර්ථකථනය නොකළ යුතු බවත්, ඒ මත පදනම්ව රෝහලේ ක්‍රියාකාරීත්වය තීරණය කළ නොහැකි බවත් කාරක සභාවට නිරීක්ෂණය විය.

## 15. <u>2023.07.21 දින පැවැති දෙවන අනු කාරක සභාව විසින් ලබා දී තිබූ නිර්දේශ අංක 07 (ශ්‍රී ජයවර්ධනපුර රෝහල් මණ්ඩලය කාර්යක්ෂම රාජ්‍ය ව්‍යවසායක් බවට පත් කිරීම.)</u>

2023 ජූලි 21 දින පැවැති පොදු ව්‍යාපාර පිළිබඳ දෙවන අනු කාරක සභාව විසින් ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලයට මහා භාණ්ඩාගාරයෙන් මුදල් ලබා ගැනීමකින් තොරව ක්‍රියාත්මක වන ස්වයං මූල්‍ය ව්‍යාපාරයක් බවට පත් කිරීම සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරි/ගණන්දීමේ නිලධාරි වෙත ලබා දී තිබූ නිර්දේශය පිළිබඳ කාරක සභාව අවධානය යොමු කළ අතර, ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලය ව්‍යාපාරික ආකෘතිය තුළ ගුණාත්මක සේවා සහනදායි මිලට සපයන, සෙසු පෞද්ගලික රෝහල්වල මිල නියාමනයට ද මඟ පෙන්වන ලාභ ලබන කාර්යක්ෂම රාජ්‍ය ව්‍යවසායක් ලෙස ක්‍රියාත්මක රෝහලක් බවට පත් කිරීම වඩාත් සුදුසු බව කාරක සභාව විසින් අවධාරණය කරන ලදි.

## 16. <u>රෝහලේ අනාගත කළමනාකරණ ආකෘතිය</u>

ශ්‍රී ජයවර්ධනපුර රෝහලේ කළමනාකරණ ආකෘතිය අසාර්ථක බව තහවුරු වී ඇති බවත්, එම නිසා මෙම රෝහල සහ විජය කුමාරතුංග අනුස්මරණ රෝහල එක් පරිපාලන යාන්ත්‍රණයක් යටතේ හෝ පවතින සම්පත් ප්‍රශස්ථව උපයෝජනය කළ හැකි සුදුසු ව්‍යාපාරික ආකෘතියක් යටතේ ගුණාත්මක සේවාවක් සැපයිය හැකි තත්ත්වයකට පත් කිරීමට අමාත්‍ය මණ්ඩලය තීරණය කර ඇති බව කාරක සභාවට නිරීක්ෂණය විය.

නමුත් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ පරිපාලන ව්‍යුහය අනුව ශ්‍රී ජයවර්ධනපුර රෝහල සහ විජය කුමාරතුංග අනුස්මරණ රෝහල එක් පරිපාලන යාන්ත්‍රණයක් යටතට ගෙන ඒම අසීරු බැවින් සුදුසු ව්‍යාපාරික ආකෘතියක් යටතේ සම්පත් ප්‍රශස්ථව භාවිතා කරමින් ගුණාත්මක සේවාවක් සපයන තත්ත්වයට පත් කිරීම සුදුසු බව ද කාරක සභාවට නිරීක්ෂණය විය.

ඊට අමතරව, රෝහල සම්පූර්ණයෙන්ම රාජ්‍ය හෝ සම්පූර්ණයෙන් පෞද්ගලික ආකෘතියකට ගෙන යාම මේ මොහොතේ දුෂ්කර විය හැකි බැවින්, අතරමැදි ආකෘතියක් ලෙස එනම් පෞද්ගලික රෝහල් සඳහා ක්‍රියාත්මක වන නියාමන ආකෘතියක් අනුව මෙම රෝහල පවත්වාගෙන යා හැකිද යන්න පිළිබඳව අවධානය යොමු කළ යුතු බවත්, එවැනි ආකෘතියක් තුළින් රෝගීන්ට දැරිය හැකි මිලකට සේවා සැපයීම සහතික කළ හැකි බවත් කාරක සභාව නිරීක්ෂණය කළාය.

<u>කාරක සභාවේ නිර්දේශය</u>

**I. රාජ්‍ය ව්‍යාපාර ඒකාබද්ධකරණය සම්බන්ධ තීන්දු තීරණ ද සලකා බලා ශ්‍රී ජයවර්ධනපුර රෝහල් මණ්ඩලයේ සංවර්ධනය සඳහා අවශ්‍ය වන පරිදි 1983 අංක 54 දරන ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා මණ්ඩල පනත සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.**

<u>නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>

ලේකම් - සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

<u>කාරක සභා නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය</u>

නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය 2025.06.30 වැනි දින තෙක් කාරක සභාවට වාර්තා කර නොමැත.

**17.** <u>ආදායම් උපයා ගැනීම සහ කළමනාකරණය</u>

රෝහලේ ආදායම අඩු වීම සඳහා රෝගීන් ගාස්තු නොගෙවා පිට වී යාම සහ රෝහලට අයවිය යුතු ශේෂ අයකර නොගැනීම ප්‍රධාන වශයෙන් හේතු වී ඇති බව විගණකාධිපති වාර්තාවල සඳහන් වී ඇති බව කාරක සභාව නිරීක්ෂණය කළාය.

තවද රෝහලේ බාහිර රෝගී අංශයේ ගාස්තුව ඉතා අඩු මට්ටමක පැවතීමත්, රෝහලේ ඖෂධ ශාලාව බාහිර පාර්ශවයකට කුලියට දී තිබීමත් ආදී කරුණු ද මේ සඳහා බලපා ඇති බව ද නිරීක්ෂණය විය.

නමුත් දැනටත් ඖෂධ ලබා ගන්නේ රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවෙන් 10-15% ක ලාභයක් සහිතව වන බැවින් එය රෝහල යටතට ගැනීම ඖෂධ මිල අඩු කිරීමට එතරම් සහය නොලැබෙන බව කාරක සභාවට අනාවරණය විය.

## 18. <u>ඩිජිටල්කරණය කිරීම</u>

නව තාක්ෂණික භාවිතාවන්ගෙන් යුක්තව ඩිජිටල්කරණය කිරීම (Digitalization) ඉතා කඩිනමින් අවසන් කරන ලෙස 2023 ජූලි 21 දින පැවැති පොදු ව්‍යාපාර පිළිබඳ දෙවන අනු කාරක සභාව විසින් ගණන්දීමේ නිලධාරි වෙත නිර්දේශ ලබා දී තිබුණි.

එහි ප්‍රගතිය සම්බන්ධයෙන් රෝහලේ ඩිජිටල්කරණ ක්‍රියාවලිය සිදුවෙමින් පවතින බවත්, එහිදී පද්ධති දෙකක් ක්‍රියාත්මක වන බවත් ක්‍රියාවලීන්ගෙන් 85%කට වඩා දැනටමත් ඩිජිටල්කරණය වී ඇති බවත්, රසායනාගාර වාර්තා ජංගම දුරකථන වෙත SMS මාර්ගයෙන් යොමු කරන බවත්, ඉලෙක්ට්‍රොනික වෛද්‍ය වාර්තා (Electronic Medical Records) කටයුතු සිදු කරමින් පවතින බවත් කාරක සභාවට අනාවරණය විය.

## 19. <u>අධ්‍යක්ෂ මණ්ඩල සඳහා විද්‍යුත් ලිපි ලේඛන කළමනාකරණ පද්ධතියක් (Electronic Document Management System) සැකසීම</u>

ශ්‍රී ජයවර්ධනපුර මහරෝගාශාලාවේ අධ්‍යක්ෂ මණ්ඩල සඳහා විද්‍යුත් ලිපි ලේඛන කළමනාකරණ පද්ධතියක් (Electronic Document Management System) සැකසීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීමට අදාළ කොන්ත්‍රාත්තුව 2015.11.26 දින කාර්යය මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකුගේ භාර්යාව අධ්‍යක්ෂකවරියක් ලෙස කටයුතු කළ සමාගමකට පවරා තිබුණි. එම මෘදුකාංගය සඳහා රුපියල් මිලියන 1.8 ක් ද scanning සහ uploading කටයුතු සඳහා 2019.12.31 වන විට රුපියල් මිලියන 19.7 ක් වැය කිරීම සම්බන්ධයෙන් ලබැඳියාවේ ගැටුමක් ඇති වී තිබුණු බැවින් ව්‍යවස්ථානුකූලතා හා නීතිමය ගැටලු ඇති කළේය. එමනිසා, 2023 ජූලි 21 දින පැවැති පොදු ව්‍යාපාර පිළිබඳ දෙවැනි අනු කාරක සභාවේදී, මේ පිළිබඳව විධිමත් විනය පරීක්ෂණයක් කඩිනමව සිදු කිරීමටත්, පරීක්ෂණය ප්‍රමාද වීමේ හේතු සඳහන් සවිස්තරාත්මක වාර්තාවක් සහ ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාවක්

සතියක් ඇතුළත අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට ඉදිරිපත් කළ යුතු බවටත් නිර්දේශ කර තිබුණි.

2019 පෙබරවාරි 11 දින එවකට සිටි සභාපතිවරයාගේ උපදෙස් මත scanning සහ uploading කටයුතු තාවකාලිකව නවතා දැමූ බවත්, අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන කාලයේ පරිලෝකනය කර උඩුගත කළ දත්ත තවදුරටත් රෝහල විසින් භාවිත කරන බවත්, මෙම ව්‍යාපෘතිය රෝගී වාර්තා ගබඩා කර තැබීම සඳහා වැය වන ඉඩ අවම කිරීමේ අරමුණින් ක්‍රියාත්මක කර තිබෙන බවත් කාරක සභාවට අනාවරණය විය.

එමෙන්ම, අධිකරණ කටයුතු සඳහාද මෙම වාර්තා භාවිත කර ඇති අතර, කිසිඳු නීතිමය ගැටළුවක් මෙතෙක් ඇති වී නොමැති බවද නිරීක්ෂණය විය.පුවත්පත් දැන්වීමක් මඟින් මිල ගණන් කැඳවා අවම මිල ඉදිරිපත් කළ ආයතනය මෙම ව්‍යාපෘතිය සඳහා තෝරා ගෙන තිබූ අතර, ඒ සඳහා තොරතුරු තාක්ෂණ උපදේශකවරයෙකුගේ නිර්දේශය ද ලැබී තිබුණි.

එම සමාගම අදාළ කාර්යය සඳහා පළපුරුද්දක් සහිත ආයතනයක් නොවූ බවත්, එවකට සිටි අධ්‍යක්ෂවරයාගේ භාර්යාවගේ සමාගමක් වන බව පසුව විගණන විමසුමකින් හෙළිවූ බවත් කාරක සභාවට නිරීක්ෂණය විය.

පරිලෝකනය කරන ලද දත්ත, මුල් මූලාශ්‍රයක් (Primary Source) ලෙස භාවිතා කළ නොහැකි බවටත්, ද්විතීයික ලේඛනයක් (Secondary Document) ලෙස පමණක් භාවිත කළ හැකි බවත්, තොරතුරු දැන ගැනීමේ පනත අනුව නිසි පරිදිම තොරතුරු ගබඩා කළ යුතු බවටත් Scanning සහ Uploading කර ඇති ලේඛනවල මුල් පිටපත් විනාශ කිරීම සම්බන්ධව නීතිපතිවරයා විසින් උපදෙස් ලබා දී තිබුණි. වගකීම් සහගත මෙවන් කාර්යයක් අත්දැකීම් රහිත සමාගමකට පැවරීම බරපතල වරදක් වන බැවින් තාක්ෂණික ඇගයීම් කමිටුවේ ක්‍රියාවලිය ද අඩුපාඩු සහිත බව කාරක සභාවට නිරීක්ෂණය විය.

මේ සම්බන්ධව සිදුකර ඇති විධිමත් විනය පරීක්ෂණය මඟින් මෙයට වගකිව යුතු නිලධාරියාගේ වැටුප් වර්ධක ත්‍රිත්වයක් විලම්භනය කිරීම දඬුවමක් ලෙස

ලබා දී තිබුණි. රජයේ මුදල්වලට මෙතරම් හානියක් සිදු කර තිබියදී ලබා දී ඇති දඬුවම ප්‍රමාණවත්ද යන්න පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

**I. විධිමත් විනය පරීක්ෂණ වාර්තාව කාරක සභාවට යොමු කිරීම.**

**II. විධිමත් විනය පරීක්ෂණ කමිටුව විසින් ලබා දී ඇති දඬුවම ප්‍රමාණවත්ද යන්න නැවත සලකා බලා නිසි ක්‍රියාමාර්ග ගැනීම.**

**III. මූලික පරීක්ෂණ මණ්ඩල, විධිමත් විනය පරීක්ෂණ මණ්ඩල සහ මුදල් රෙගුලාසි 104 (1) යටතේ පරීක්ෂණ සිදු කිරීමට පරීක්ෂණ මණ්ඩල පත් කිරීමේ දී වගකීම් සහගත, දැනුම සහ පළපුරුද්ද ඇති නිලධාරින් පත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම සහ පරීක්ෂණ වාර්තා අනුව වගකිව යුතු නිලධාරින්ට ලබා දී ඇති දඬුවම සහ සිදු කර ඇති වරද පිළිබඳව සලකා බැලීම.**
**මේ සම්බන්ධව වාර්තාවක් කාරක සභාවට සහ විගණකාධිපතිට මාස 01 ක් තුළ ඉදිරිපත් කිරීම.**

<u>නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>

ලේකම් - සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

<u>කාරක සභා නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය</u>

නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය 2025.06.30 වැනි දින තෙක් කාරක සභාවට වාර්තා කර නොමැත.

**20. <u>ස්නායු ශල්‍ය ඒකකය සඳහා රුපියල් මිලියන 4.12 වැය කර මිලදී ගෙන තිබුණු ශල්‍ය ද්‍රව්‍ය වලින් සියයට 80ක් භාවිතයෙන් තොරව කල් ඉකුත් වීම</u>**

ස්නායු ශල්‍ය ඒකකය සඳහා රුපියල් මිලියන 4.12 වැය කර මිලදී ගෙන තිබුණු ශල්‍යද්‍රව්‍ය වලින් සියයට 80ක් භාවිතයෙන් තොරව කල් ඉකුත් වීමට වගකිව යුතු නිලධාරින් සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබීම පිළිබඳ

වාර්තාවක් සති දෙකක් ඇතුළත කාරක සභාවට එවීමට කටයුතු කරන ලෙස පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් නිර්දේශ කර තිබුණි.

ඒ අනුව ප්‍රධාන ගණන් දීමේ නිලධාරි විසින් කාරක සභාව වෙත යොමු කරන ලද නිර්දේශ ඇතුළත් වාර්තාවට අනුව රජයට සිදු වී ඇති පාඩුව වැළැක්වීමට ක්‍රියාමාර්ග නොගැනීම සම්බන්ධයෙන් රෝහලේ පාලනාධිකාරිය ඇතුළු ඊට සම්බන්ධ සියලුම නිලධාරින් සාමූහිකව වගකිවයුතු බව සඳහන් කර තිබුණි. නමුත්, මුදල් රෙගුලාසි104(1) අනුව කරන ලද පරීක්ෂණ වාර්තාවට අනුව රජයට සිදු වී ඇති පාඩුව සම්බන්ධයෙන් නිලධාරින් සෘජුවම වගකිවයුතු නොවන බව දක්වා ඇති බව කාරක සභාවට නිරීක්ෂණය විය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

**I. ප්‍රධාන ගණන් දීමේ නිලධාරි විසින් කාරක සභාව වෙත යොමු කරන ලද නිර්දේශ ඇතුළත් වාර්තාව අනුව රජයට සිදු වී ඇති පාඩුව වැළැක්වීමට ක්‍රියාමාර්ග නොගැනීම සම්බන්ධයෙන් රෝහලේ පාලනාධිකාරිය ඇතුළු ඊට සම්බන්ධ සියලුම නිලධාරින් සාමූහිකව වගකිවයුතු බව දක්වා තිබියදී මුදල් රෙගුලාසි104(1) අනුව කරන ලද පරීක්ෂණ වාර්තාවට අනුව රජයට සිදු වී ඇති පාඩුව සම්බන්ධයෙන් නිලධාරින් සෘජුවම වගකිවයුතු නොවන බව දක්වා තිබීම තුළින් ඇති වන පරස්පරතාවය පිළිබඳ සොයා බලා එය නිවැරදි කිරීමට කටයුතු කර මාස 01 ක් තුළ කාරක සභාවට සහ විගණකාධිපතිට වාර්තා කිරීම.**

<u>නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>

ලේකම් - සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

<u>කාරක සභා නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය</u>

නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය 2025.06.30 වැනි දින තෙක් කාරක සභාවට වාර්තා කර නොමැත.

**21. <u>ශ්‍රී ජයවර්ධනපුර මහරෝගාශාලා මණ්ඩලයේ ගෙවන වාට්ටු කාමර 04 ක් විශේෂ කාමර (Family room) ලෙස නවීකරණය කිරීම ඇතුළුව කාමර 50 ක් නවීකරණය කිරීම</u>**

(i) ශ්‍රී ජයවර්ධනපුර මහරෝගාශාලා මණ්ඩලයේ කාමර 50 ව්‍යාපෘතිය සඳහා අඟල් 32 ප්‍රමාණයේ රූපවාහිනී යන්ත්‍ර 25ක් මිලදී ගැනීමට අනුමැතිය ලබා දී තිබුණ ද, ඊට අනුකූල නොවී රු. 2,636,100 ක (වැට් සහිතව) මුදලකට අඟල් 43 ප්‍රමාණයේ රූපවාහිනී යන්ත්‍ර 25ක් මිලදීගෙන තිබුණි. මෙම වෙනස්කම කවුරුන් විසින් සිදු කළාද යන්න නිලධාරීන් නොදැනුවත් බව කාරක සභාවට අනාවරණය විය.

රූපවාහිනී යන්ත්‍ර සවි කිරීමට ප්‍රමාද වීමේ හේතුව ලෙස Wall Brackets නොමැති බව දැනුම් දී තිබූ නමුත්, පසුව ඒවා ඇසුරුම් පෙට්ටිය තුළ තිබූ බව හෙළිවී ඇත. 2025 අප්‍රේල් 30 වන විට ද රූපවාහිනී යන්ත්‍ර 10ක් භාවිතයට ගෙන නොමැති බව කාරක සභාවට නිරීක්ෂණය විය.

(ii) මෙම ව්‍යාපෘතියට අදාළව (18000 BTU Non Inverter) වායුසමීකරණ යන්ත්‍ර 18ක් රු. 4,560,228 කට මිලදී ගැනීමට අනුමැතිය ලබාදී තිබුණු අතර, ප්‍රසම්පාදන කමිටුවේ සභාපති සහ නියෝජිතයන් දෙදෙනෙකුගේ අනුමැතිය මත ගැනුම් ඇණවුම් නිකුත් කර පසුව ප්‍රසම්පාදන කමිටුවේ ආවරණ අනුමැතිය මත ප්‍රසම්පාදනය සිදු කර තිබුණි. මේ සඳහා අත්තිකාරම් ඇපකරයක් මත කොන්ත්‍රාත් මුදලින් 30% ක් වූ රු. 1,159,380/- ක මුදලක් ගෙවීම් කර තිබුණි. 2024 සැප්තැම්බර් 13 දින යන්ත්‍ර 18 ක් ලැබී තිබුණු අතර 2025 අප්‍රේල් 30 වන විට ඉන් යන්ත්‍ර 5 ක් පමණක් භාවිතයට ගෙන ඇති අතර ඉතිරි යන්ත්‍ර 13 ආපසු සැපයුම්කරු වෙත යැවීමට කටයුතු කර තිබුණි.

මෙම ව්‍යාපෘතිය පිළිබඳ ගැටලුකාරී තත්ත්වයක් පවතින බවත්, කාමර නවීකරණය කිරීමට පෙර භාණ්ඩ මිලදී ගෙන ඇති බවත්, අමාත්‍ය මන්ඩල නිර්දේශයක් උපකාරී කර ගෙන රු. මිලියන 50 ක් දක්වා එක ආයතනයකින් මිලදී ගත හැකි ක්‍රමවේදයක් උපයෝගී කර ගෙන, නිසි අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව කළමනාකරණ කමිටුවේ අනුමැතියකින් පමණක් මෙම මිලදී ගැනීම් සිදු කොට තිබූ බවත් කාරක සභාවට නිරීක්ෂණය විය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

**I.රූපවාහිනි යන්ත්‍ර මිලදී ගැනීමට අදාළ ප්‍රසම්පාදනයට හා තාක්ෂණික ඇගයීමට අදාළ සියලු වාර්තා කාරක සභාවට ඉදිරිපත් කිරීම.**

**II.සියලුම රූපවාහිනි යන්ත්‍ර සවිකර භාවිතයට ගැනීම සහ ඒ පිළිබඳව ස්ථානීය පරීක්ෂණ සිදු කර කාරක සභාවට සහ විගණකාධිපතිට වාර්තාවක් සතියක් තුළ ඉදිරිපත් කිරීම.**

<u>නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>

සභාපති - ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලය

<u>කාරක සභා නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය</u>

නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය 2025.06.30 වැනි දින තෙක් කාරක සභාවට වාර්තා කර නොමැත.

**22. <u>2024 වර්ෂයේ මැතිවරණ කාලසීමාව තුළ ශ්‍රී ජයවර්ධනපුර මහරෝග්‍යශාලා මණ්ඩලය සඳහා නියමිත බඳවාගැනීමේ ක්‍රමවේදයෙන් බැහැරව බඳවා ගැනීම් සිදු කිරීම</u>**

2024 මැතිවරණ කාලසීමාව තුළ ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල සඳහා නියමිත බඳවාගැනීමේ ක්‍රමවේදයෙන් බැහැරව කළමනාකරණ සහකාර 48 දෙනෙකු, රියදුරු 6 දෙනෙකු සහ සෞඛ්‍ය කාර්ය සහායක 95 දෙනෙකු සේවයට බඳවාගෙන 2024 ජුලි සිට 2025 අප්‍රේල් 30 දක්වා වැටුප් සහ දීමනා සඳහා රු. 96,305,351 ක් ගෙවා තිබුණි.

රියදුරන් සම්බන්ධයෙන් නියමිත බඳවාගැනීමේ ක්‍රමවේදය අනුව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් සහ ප්‍රායෝගික පරීක්ෂණයක් පවත්වා, එම පරීක්ෂණ දෙකෙන්ම සමත්වන තැනැත්තන් බඳවාගැනීමට කටයුතු කළ යුතු වුවද, මෙහිදි ප්‍රායෝගික පරීක්ෂණයක් සිදුකර නොමැති බවත්, පසුව පැවැත්වූ වෘත්තීය පරීක්ෂණය මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මෝටර් රථ

වාහන පරීක්ෂකවරයෙකු පත්කර ගැනීමකින් තොරව සිදුකර ඇති බවත් කාරක සභාවට නිරීක්ෂණය විය.

සෞඛ්‍ය අමාත්‍යාංශ උපදෙස් අනුව බඳවා ගැනීම් සිදු කර ඇති බවටත්, රියදුරන් සඳහා වෘත්තීය පරීක්ෂණයක් පැවැත්වීමට ඉල්ලා සිටි බවටත්, පරීක්ෂණයෙන් සමත් වනතුරු වැටුප් ගෙවීම නතර කළ බවත්, මැතිවරණ කාලය හේතුවෙන් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් අවශ්‍ය සහය නොලැබුණු බවටත්, ඒ වෙනුවට ප්‍රවාහන අංශ ප්‍රධානියෙකු සහ පොලිස් නිලධාරින් සම්බන්ධ කර පරීක්ෂණ පැවැත්වූ බවත්, මෙම කටයුතු හිටපු සභාපතිවරයා විසින් ලබා දුන් වාචික නියෝග මත සිදු කරනු ලැබූ බවත්, රෝහල් අධ්‍යක්ෂතුමා ඒ කටයුත්තට සම්බන්ධ නොවූ බවටත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ පරිපාලන නිලධාරිනිය කරුණු අනාවරණය කරන ලදී.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

**I.මෙම සම්පූර්ණ ක්‍රියාවලිය පිළිබඳ විධිමත් පරීක්ෂණයක් පවත්වා වගකිවයුතු සියලු නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීම සහ ගනු ලැබූ විනය ක්‍රියාමාර්ග පිළිබඳව වාර්තාවක් මාස 01 ක් තුළ කාරක සභාවට සහ විගණකාධිපතිට ඉදිරිපත් කිරීම.**

<u>නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>

ලේකම් - සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

<u>කාරක සභා නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය</u>

නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය 2025.06.30 වැනි දින තෙක් කාරක සභාවට වාර්තා කර නොමැත.

## 23. <u>වෙනස් කළ හැකි රෝගී ඇඳන් මිලදී ගැනීම (Procurement of Adjustable Patient Beds):</u>

කාමර සඳහා වෙනස් කළ හැකි රෝගී ඇඳන් සහ මෙට්ට (Adjustable Patient beds with mattresses) 50 ක් මිලදී ගැනීමට ගෘහ භාණ්ඩ හා වෙනත් උපකරණ යටතේ මිල ගණන් කැඳවා තිබුණද, පිරිවිතරවලට අනුකූල නොවීම හේතුවෙන් 2024 අගෝස්තු 28 දින නැවත මිල ගණන් කැඳවා තිබුණු අතර

සපයන ලද නියැදිය තාක්ෂණික ඇගයීම් කමිටුව 2024 සැප්තැම්බර් 05 දින පරීක්ෂා කළ බවත්, එය අදාළ පිරිවිතරයන්ට අනුකූල බව දක්වා තිබූ බවත්, මෙම රෝගී ඇඳන් (Adjustable Patient beds) ජීව වෛද්‍ය උපකරණයක් වන අතර රෝහලේ ජීව වෛද්‍ය ඉංජිනේරුවෙකු සේවයේ යෙදී සිටියදී එවැනි උපකරණ සම්බන්ධයෙන් දැනුමක් සහිත නිලධාරියෙකු තාක්ෂණික ඇගයීම් කමිටුවට පත්කිරීමට කටයුතු කර නොතිබුණු අතර මේ හේතුවෙන් සකස් කළ පිරිවිතරවල නිවැරදිතාවය හා භාණ්ඩවල ප්‍රමිතිය පිළිබඳව විගණනයේදී තහවුරු කර ගත නොහැකි වී ඇති බව කාරක සභාවට නිරීක්ෂණය විය.

මෙම රෝගී ඇඳන් ජීව වෛද්‍ය උපකරණයක් ලෙස සැලකෙන බැවින්, එවැනි උපකරණ සම්බන්ධයෙන් දැනුමක් සහිත නිලධාරීන් තාක්ෂණික ඇගයීම් කමිටුවට පත් කර නොතිබීම ගැටලුකාරී බවත්, මෙවැනි මිලදී ගැනීම් සඳහා ජීව වෛද්‍ය ඉංජිනේරුවරයෙකු සම්බන්ධ විය යුතු බවත්, මෙම ඇඳන් සඳහා ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) ලියාපදිංචිය අවශ්‍ය වන අවස්ථා ඇති බවත්, ඇතැම් අවස්ථාවල ලියාපදිංචිය ලබා දීමේ ප්‍රමාදයන් සිදුවන බවත් කාරක සභාව නිරීක්ෂණය කළාය.

## 24. <u>මෙරපෙනම් (Meropenem) ඖෂධය දේශීයව මිලදී ගැනීම සම්බන්ධ ගැටළු (Issues regarding Local Purchase of Meropenem Drug)</u>

2014 නොවැම්බර් 28 දින කායික රෝග විශේෂඥ වෛද්‍යවරයා විසින් මෙරපෙනම් (Meropenem) ඖෂධයේ නිශ්චිත වෙළඳ නාම දෙකක් සඳහා රෝහලේ ඇති මුල් වෙළඳ නාමයට (original brand) වඩා මිල අඩුවීම සහ රෝගීන් ඉක්මනින් සුවය ලැබීම යන හේතු ඉදිරිපත් කරමින් එම ඖෂධ ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඒ මත ඖෂධ දී ඇති බවත්, මෙම රෝහලේම සේවය කරන විශේෂඥ වෛද්‍යවරුන් කණ්ඩායමක් විසින් එකී ඖෂධ දෙකෙහි බැක්ටීරියා නිරෝධය (inhibition) කිරීමේ සැලකිය යුතු වෙනසක් නොමැති බවට in-vitro අධ්‍යයනයන් සිදුකර ඇති බවටත් කාරක සභාවට නිරීක්ෂණය විය.

රෝහලේ මෙරපෙනම් ඖෂධ තොග තිබියදී 2024 ජනවාරි 01 සිට නොවැම්බර් 28 දක්වා මාස 11ක කාලය තුළ රුපියල් මිලියන 40 කට ආසන්න ප්‍රමාණයක් වැය කොට එම ඖෂධය දේශීයව මිලදී ගැනීම්වලින් (මිලියන 823) 50%කට ආසන්න ප්‍රමාණයක් බවත් කාරක සභාවට අනාවරණය විය.

මෙම කාලය තුළ රෝහල සතුව මෙරපෙනම් තිබුණේද යන්න කාරක සභාව විසින් විමසන ලද අතර, වෛද්‍ය සැපයීම් අංශයෙන් (MSD) නොලැබෙන අවස්ථාවලදී අවශ්‍යතාවය පරිදි දේශීයව මිලදී ගන්නා බවත්, වෛද්‍ය සැපයීම් අංශයේ ප්‍රමාණවත් තොග පැවති සෑම අවස්ථාවකදීම ඖෂධය රෝහල සතුව තිබූ බවත් ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලයේ ප්‍රධාන ඖෂධවේදී විසින් කරුණු දක්වන ලදී.

ඖෂධයක තොග පවතින විට දේශීයව මිලදී ගැනීම සිදු කළ නොහැකි බව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා මෙහිදී කාරක සභාවට දැනුම් දෙන ලදී.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

**I.සායනික ඇගයීමක් සිදු කර මෙම ඖෂධ මිලදී ගැනීම.**

**II.මෙම ක්‍රියා පිළිබඳ විධිමත් පරීක්ෂණයක් පවත්වා මෙවැනි තත්ත්ව නිවැරදි කිරීමට කඩිනමින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.**

<u>නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>

සභාපති - ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලය

<u>කාරක සභා නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය</u>

නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය 2025.06.30 වැනි දින තෙක් කාරක සභාවට වාර්තා කර නොමැත.

**25. <u>ඖෂධ එන්නතක් අසාත්මික වීම සම්බන්ධව පළ වූ පුවත්පත් වාර්තාව</u>**

ඖෂධ එන්නතකට අසාත්මික වීම හේතුවෙන් රෝගියෙකු සිහිසුන්ව දැඩිසත්කාර ඒකකයේ දින දෙකක් ප්‍රතිකාර ලැබූ බවටත්, එම රෝගියාට මීට පෙර අසාත්මිකතා ඇති වී තිබෙන බව වෛද්‍යවරියට දැනුම් දී තිබූ බවත්, සිද්ධියෙන් පසු දුරකථනයෙන් පැමිණිලි කළද රෝහල් අධ්‍යක්ෂවරයාගෙන් ඒ සඳහා ප්‍රතිචාර නොලැබුණු බවටත් චෝදනා කරමින් පළකර තිබූ මාධ්‍ය වාර්තාවක් සම්බන්ධයෙන් කාරක සභාවේ අවධානය යොමු විය.

සිද්ධියෙන් සති දෙකකට පසු මාධ්‍ය විසින් ඒ පිළිබඳ වාර්තා කළ අතර, තමාද මාධ්‍යවේදියෙකුගෙන් එය දැනගත් බවත්, මේ සම්බන්ධව ලැබී ඇති ලිඛිත පැමිණිල්ල මත විමර්ශන කමිටුවක් විසින් විමර්ශනයක් සිදු කරන බවත්, විමර්ශන ප්‍රමාද වීම පිළිබඳවද අවධානය යොමු කර ඇති බවත් ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා අධ්‍යක්ෂවරයා විසින් කරුණු දක්වන ලදී

පරීක්ෂණ මාත්‍රාවක් ලබා දීමෙන් පසු ප්‍රධාන මාත්‍රාව ලබා දී වෛද්‍යවරිය විනාඩි 20ක් පමණ රෝගියා අසල රැඳී සිට පිටව ගොස් කෙටි කාලයක් තුළ රෝගියාට අසාධ්‍ය වූ බවට මේ සම්බන්ධව පවත්වනු ලබන විමර්ශනයේ දී හෙළි වී තිබුණි. විනාඩි 5ක් ඇතුළත විශේෂඥ වෛද්‍යවරිය ස්ථානයට පැමිණ ඇති අතර, රෝගියාගේ ලේඛනවල අසාත්මිකතාවක් ඇති විය හැකි බව සඳහන් වුවද, ඒ සම්බන්ධ බරපතලකම පැහැදිලි නොවීම හේතුවෙන් ලිඛිත පැහැදිලි කිරීමක් ලබා ගැනීමට විමර්ශන කමිටුව තීරණය කළ බවත්, එහි වාර්තාව 2025 මැයි 16 දින ලැබීමට නියමිත බවත් කාරක සභාවට අනාවරණය විය.

රෝහලේ පැමිණිලි කළමනාකරණය කිරීමේ කමිටුවක් 2024 ඔක්තෝබර් 01 දින සිට ස්ථාපිත කොට ඇති බවත්, ඊට පෙර එවැනි කමිටුවක් නොතිබූ බවත්, සිද්ධි වාර්තා කිරීම සඳහා "සිද්ධි පත්‍රිකා" ක්‍රමයක් තිබුණද, මෙම සිද්ධිය එවැනි පත්‍රිකාවක් මඟින් වාර්තා නොවීම ගැටලුවක් බවත්, ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා මණ්ඩල සභාපතිවරයා විසින් ප්‍රකාශ කරන ලදී.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

**I.පැමිණිලි විමර්ශන කමිටුවේ කටයුතු කඩිනම් කිරීම සහ මහජන පැමිණිලි ලද වහාම අදාළ පරීක්ෂණ කටයුතු ආරම්භ කළ බව සහ පරීක්ෂණය අවසන් කර තීරණය ලබා දෙන දිනය පිළිබඳ ලිඛිතව ඔවුන්ව දැනුවත් කිරීම.**

**II.රෝහලේ කීර්තිනාමයට හානියක් නොවන ආකාරයට මහජන පැමිණිලි කළමනාකරණයට අවශ්‍ය කටයුතු සිදු කර නිරන්තර අධීක්ෂණයකට ලක් කිරීම සහ ඒ පිළිබඳ වාර්තා තබා ගැනීම.**

**III.රෝහලේ කීර්තිනාමයට අහිතකර මාධ්‍ය වාර්තා කිරීම් නිවැරදි කිරීමට කටයුතු කිරීම.**

<u>නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>
සභාපති - ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලය

<u>කාරක සභා නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය</u>
නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය 2025.06.30 වැනි දින තෙක් කාරක සභාවට වාර්තා කර නොමැත.

## 26. <u>වෘත්තීය ගාස්තු සහ රෝහල් ආදායම (Professional Fees and Hospital Revenue)</u>

2023 වර්ෂයේදී මුළු කාර්ය මණ්ඩලය වෙත ගෙවූ වෘත්තීය ගාස්තු රුපියල් මිලියන 601.74 ක් වන අතර, ඉන් රෝහල ලැබූ සේවා ගාස්තුව රුපියල් මිලියන 0.95 ක් පමණක් වීම පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය.

රෝහල් සම්පත් භාවිතා කරමින් සපයන සේවා සඳහා රෝහල විසින් 0.15% ක කොටසක් සම්ප්‍රදායක් ලෙස අය කර ගන්නා බවත්, ඒ සඳහා නිශ්චිත පදනමක් හෝ ලේඛනගත කිරීමක් නොමැති බවත් කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලදී.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

**I.මෙම සියලු ගෙවීම් සඳහා නිශ්චිත විධිමත් ක්‍රමවේදයක් සකස් කර ගැනීම සහ එම ක්‍රමවේද පිළිබඳව මාස 02 ක් තුළ කාරක සභාව සහ විගණකාධිපතිවරයා දැනුවත් කිරීම.**

<u>නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>
සභාපති - ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලය

<u>**කාරක සභා නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය**</u>

නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය 2025.06.30 වැනි දින තෙක් කාරක සභාවට වාර්තා කර නොමැත.

## 27. <u>රෝහල තුළ පෞද්ගලික සේවයේ යෙදීම හා ඒ සඳහා වෘත්තීය ගාස්තු අය කිරීම</u>

රෝහල තුළ පෞද්ගලික සේවයේ යෙදවීමට හා වෘත්තීය ගාස්තු අය කිරීමට නිසි අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේදී රෝහල් කාර්ය මණ්ඩලය තුළ නොවන බාහිර වෛද්‍යවරුන් රෝහල් සම්පත් භාවිතා කරමින් ශල්‍යකර්ම සිදුකර වෘත්තීය ගාස්තු ලෙස 2022 වර්ෂයේ දී එකතුව රු.මිලියන 23.78 ක්ද 2023 වර්ෂයේ දී රු.මිලියන 11.98ක් ද රෝගීන්ගෙන් අයකර තිබුණු අතර ඉන් රෝහල වෙත සියයට 0.15 ක සේවා ගාස්තුවක් පමණක් ගෙවා ඇති බව කාරක සභාවට නිරීක්ෂණය විය.

රෝහල් සම්පත් භාවිතා කරමින් සිදු කරන මෙම කටයුතු සඳහා සම්ප්‍රදායක් ලෙස මෙම අයකිරීම් සිදු කරන බවත්, ඒ සඳහා නිශ්චිත පදනමක් හෝ ලේඛනගත කිරීමක් නොමැති බවත් ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා මණ්ඩලයේ සභාපතිවරයා විසින් කරුණු අනාවරණය කරන ලදී.

<u>**කාරක සභාවේ නිර්දේශ**</u>

**I. මෙම සියලු ගෙවීම් සඳහා නිශ්චිත විධිමත් ක්‍රමවේදයක් සකස් කර ගැනීම සහ එම ක්‍රමවේද පිළිබඳව මාස 02 ක් තුළ කාරක සභාව සහ විගණකාධිපතිවරයා දැනුවත් කිරීම**

<u>**නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**</u>

සභාපති - ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා මණ්ඩලය

<u>**කාරක සභා නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය**</u>

නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය 2025.06.30 වැනි දින තෙක් කාරක සභාවට වාර්තා කර නොමැත.

## 28. <u>රෝහල් වියදම් ගණනය කිරීම් සහ මිල නියම කිරීමේ පද්ධතිය</u>

රෝහලට නිශ්චිත වියදම් ගණනය කිරීමේ ක්‍රමවේදයක් මීට පෙර නොතිබූ බවත්, 2025 අප්‍රේල් මස අවසන් වන විට සියලුම රෝගී සත්කාර සේවාවන් සඳහා වියදම් ගණනය කිරීම් අවසන් කර ඇති බවත්, මැයි මස අවසානයේ අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කර මිල නියම කිරීමේ කටයුතු අනුමත කර ගැනීමට බලාපොරොත්තු වන බවත්, නව ක්‍රමවේදය තුළින් රෝගීන්ගෙන් අය කරන මුදල් නිශ්චිතව ලේඛනගත කිරීමට හැකි වන බවත් කාරක සභාවට අනාවරණය විය.

## 29. <u>රෝගීන්ගේ රෝහල් ගාස්තු බිල්පත් ගෙවීම්වලින් නිදහස් කර තිබීම</u>

නිශ්චිත ක්‍රමවේදයකින් /පදනමකින් තොරව ඉහළ කළමනාකාරීත්වයේ අනුමැතීන් මත ඇතැම් රෝගීන්ගේ රෝහල් ගාස්තු බිල්පත් ගෙවීම්වලින් නිදහස් කර ඇති බවත් 2016,වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා එකතුව රු.මිලියන 28.82ක බිල්පත් නිදහස් කර තිබුණු බවත්, 2017 වර්ෂයේ දී බැරපත් මගින් මෙම ගිණුම් වලින් එකතුව රු.මිලියන 6.4ක බිල්පත් ඉවත් කිරීමට හේතු විගණනයට පැහැදිලි කොට නොතිබුණි.

මේ සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් විමර්ශනයක් සිදු කරන බවත්, 2014 සිට 2024 දක්වා කාලය තුළ සිදුවීම් පිළිබඳව තොරතුරු රැස් කරමින් සිටින බවත්, කාරක සභාව නිරීක්ෂණය කරන ලදී.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

**I.රෝගීන්ගේ රෝහල් ගාස්තු බිල්පත් ගෙවීම්වලින් නිදහස් කර තිබීම පිළිබඳව අමාත්‍යාංශය විසින් සිදු කරමින් පවතින පරීක්ෂණය අවසන් වූ පසු එහි වාර්තාව කඩිනමින් කාරක සභාවට සහ විගණකාධිපතිට ඉදිරිපත් කිරීම.**

<u>නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>

ලේකම් - සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

සභාපති - ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා මණ්ඩලය

**කාරක සභා නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය**

නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය 2025.06.30 වැනි දින තෙක් කාරක සභාවට වාර්තා කර නොමැත.

## 30. රෝහල් ගාස්තු බිල්පත් නොගෙවා රෝහලෙන් බැහැරවූ රෝගීන්ගෙන් අයවිය යුතු මුදල් අය කිරීම

රෝහල් ගාස්තු බිල්පත් නොගෙවා රෝහලෙන් බැහැරවූ රෝගීන්ගෙන් අයවිය යුතු බිලපත්වල එකතුව ලෙස රු. මිලියන 23.07 ක ණයගැති ශේෂයක් පැවති අතර මෙම බිල්පත්වල වටිනාකම රු.360 සිට රු.මිලියන 2.04 දක්වා වූ පරාසයක විය. රෝගීන් රෝහලෙන් බැහැරව යාමේදී රෝහල් ගාස්තු අයකර නොතිබීමට හේතු විගණනයට පැහැදිලි කොට නොතිබුණි.

මෙම ගාස්තු අය කිරීම් සිදු කිරීමට තොරතුරු රැස් කර, අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව කාරක සභාව නිරීක්ෂණය කරන ලදී.

**කාරක සභාවේ නිර්දේශ**

**I. මේ පිළිබඳව සොයා බලා අදාළ අය විය යුතු මුදල් අය කර ගැනීමට කඩිනමින් කටයුතු කිරීම සහ ඒ පිළිබඳව කාරක සභාව සහ විගණකාධිපතිවරයා දැනුවත් කිරීම.**

**නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**

සභාපති - ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලා මණ්ඩලය

**කාරක සභා නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය**

නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය 2025.06.30 වැනි දින තෙක් කාරක සභාවට වාර්තා කර නොමැත.

## 31. <u>නොමිලේ ප්‍රතිකාර ලබා දීමේ ප්‍රතිපත්තිය (Free Treatment Policy)</u>

රෝහල් සේවකයින්ට, ඔවුන්ගේ යැපෙන්නන්ට, ශ්‍රී ලංකාවේ සිටින පූජ්‍ය පක්ෂයේ අයට සහ විශ්‍රාමික සේවකයින්ට (රුපියල් 40,000 ක සීමාවකට යටත්ව) නොමිලේ ප්‍රතිකාර ලබා දීම සම්ප්‍රදායක් ලෙස සිදු වන බවත්, නිසි ක්‍රමවේදයක් යටතේ එය සිදු නොවන බවත් ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා මණ්ඩලයේ සභාපතිවරයා විසින් කරුණු දක්වන ලදී.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

**I. මෙම සේවා ලබා දීම සඳහා නිශ්චිත ප්‍රතිපත්තියක් සහ ක්‍රමවේදයක් සකස් කර ලේඛනගත කිරීමට කඩිනමින් අවශ්‍ය කටයුතු කිරීම සහ ඒ පිළිබඳ කාරක සභාව සහ විගණකාධිපතිවරයා දැනුවත් කිරීම.**

<u>**නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**</u>

සභාපති - ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා මණ්ඩලය

<u>**කාරක සභා නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය**</u>

නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය 2025.06.30 වැනි දින තෙක් කාරක සභාවට වාර්තා කර නොමැත.

## 32. <u>ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලා මණ්ඩලයේ ෆාමසිය</u>

ෆාමසිය (Pharmacy) ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල් මණ්ඩලය යටතට ගැනීමට සහ සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා 2023 ජූලි 21 දින පැවැති පොදු ව්‍යාපාර පිළිබඳ දෙවන අනු කාරක සභාව විසින් ගණන්දීමේ නිලධාරී වෙත නිර්දේශ කොට තිබුණි.

ඖෂධ මිලදී ගැනීම වෛද්‍ය සැපයීම් අංශය මඟින් සිදු කර නැවත ෆාමසිය හරහා අලෙවි කිරීමට සිදු වන බැවින්, ෆාමසිය රෝහල් මණ්ඩලය යටතට ගැනීම තුළින් රෝගීන්ට ඖෂධ අඩු මිලට ගැනීමේ හැකියාවක් ඇති නොවන බව කාරක සභාවට නිරීක්ෂණය විය.

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දසවැනි පාර්ලිමේන්තුවේ*
*පළමුවැනි සභාවාරයේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ තෙවැනි වාර්තාව*